**ශීර්ෂය 103 - රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

**1 කොටස**

**-----------**

**රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 222 | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව |
| 223 | ශ්‍රී ලංකා නාවික හමුදාව |
| 224 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව |
| 225 | පොලිස් දෙපාර්තමේන්තුව |
| 226 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව |
| 227 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව |
| 291 | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 320 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව |
| 325 | වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 09 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.297,727,997,200 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.274,104,266,569 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය හා එක් එක් දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.1,969,242 ත් රු.10,678,833,793 ත් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.02 ත් සියයට 59.06 ත් අතර පරාසයක ප්‍රමාණයකින් පැවතුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| 103 | 29,592,257,000 | 21,677,488,000 | 7,914,769,000 | 26.75 |
| 222 | 122,630,339,000 | 122,529,907,571 | 100,431,429 | 0.08 |
| 223 | 43,334,528,000 | 39,941,655,324 | 3,392,872,676 | 7.83 |
| 224 | 44,897,590,000 | 34,218,756,207 | 10,678,833,793 | 23.78 |
| 225 | 42,799,193,000 | 42,580,150,102 | 219,042,898 | 0.51 |
| 226 | 1,618,384,200 | 1,351,635,493 | 266,748,700 | 16.48 |
| 227 | 330,066,000 | 298,087,732 | 31,978,268 | 9.69 |
| 291 | 1,678,810,000 | 687,366,079 | 991,443,921 | 59.06 |
| 320 | 10,753,030,000 | 10,751,060,758 | 1,969,242 | 0.02 |
| 325 | 93,800,000 | 68,159,303 | 25,640,697 | 27.33 |
| **එකතුව** | **297,727,997,200** | **274,104,266,569** | **23,623,730,624** | |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් එකතුව රු.5,283,570,884 ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදන උපයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ලබාදුන් අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | ලබාගත් අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | | රු. | රු. | රු. | |
| රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 425,814,225 | 363,762,393 | 62,051,832 | 14.57 |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 368,571,777 | 366,699,042 | 1,872,735 | 0.51 |
| ප්‍රවාහන අමාත්‍යාංශය | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 84,000,000 | 83,292,407 | 707,593 | 0.84 |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 35,856,356 | 23,372,461 | 12,483,895 | 34.82 |
| ජනාධිපති කාර්යාලය | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 170,000,000 | 133,974,580 | 36,025,420 | 21.19 |
| භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 3,235,555,000 | 3,232,962,149 | 2,592,851 | 0.08 |

| | | | | | |
|---|---|---|---|---|---|
| සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 15,000,000 | 6,977,688 | 8,022,312 | 53.48 |
| රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | ශ්‍රී ලංකා නාවික හමුදාව | 233,627,247 | 185,838,491 | 47,788,756 | 20.46 |
| ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා නාවික හමුදාව | 3,270,381 | 515,409 | 2,754,972 | 84.24 |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | ශ්‍රී ලංකා නාවික හමුදාව | 16,969,423 | 1,963,055 | 15,006,368 | 88.43 |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | ශ්‍රී ලංකා නාවික හමුදාව | 521,086 | - | 521,086 | 100.00 |
| ජනාධිපති කාර්යාලය | ශ්‍රී ලංකා නාවික හමුදාව | 605,471,338 | 304,298,456 | 301,172,882 | 49.74 |
| දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ශ්‍රී ලංකා නාවික හමුදාව | 949,545 | 680,244 | 269,301 | 28.36 |
| බුද්ධශාසන අමාත්‍යාංශය | ශ්‍රී ලංකා නාවික හමුදාව | 18,874,616 | 3,443,389 | 15,431,227 | 81.76 |
| ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | ශ්‍රී ලංකා නාවික හමුදාව | 15,000,000 | 5,161,283 | 9,838,717 | 65.59 |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | 54,089,890 | 7,737,986 | 46,351,904 | 85.69 |
| එකතුව | | **5,283,570,884** | **4,720,679,033** | **562,891,851** | |

**2.2 ආදායම් ගිණුම්**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු 03 ක් විසින් 2013 වර්ෂයේ දී ආදායම් සංකේත 04 ක් සඳහා එකතුව රු.6,314,750,000 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු.7,834,093,568 ක ආදායමක් රැස්කර තිබුණි. ඇස්තමේන්තුගත ආදායමින් සියයට 97 ත් සියයට 125 ත් අතර පරාසයක ප්‍රමාණයකින් ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| **ආදායම් සංකේතය** | **2013 දෙසැම්බර් 31 දිනට** | | | **රැස්කළ ආදායම ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ඇස්තමේන්තුගත ආදායම** | **තථ්‍ය ආදායම** | **ඉක්මවීම/ (ඌනතාවය)** | |
| | **රු.** | **රු.** | **රු.** | |
| 10.03.07.05 | 12,250,000 | 11,871,917 | (378,083) | 97 |
| 20.03.02.16 | 180,000,000 | 202,791,651 | 22,791,651 | 113 |
| 20.03.02.07 | 6,040,000,000 | 7,529,000,000 | 1,489,000,000 | 125 |
| 20.03.02.03 | 82,500,000 | 90,430,000 | 7,930,000 | 110 |
| එකතුව | **6,314,750,000** | **7,834,093,568** | **1,519,343,568** | **124** |

## 2.3 අත්තිකාරම් ගිණුම

## 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 08 කට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 10301 | 200,000,000 | 99,284,696 | 110,000,000 | 140,270,439 | 5,000,000,000 | 332,606,220 |
| 22201 | 2,450,000,000 | 1,467,986,142 | 1,600,000,000 | 1,734,192,796 | 4,600,000,000 | 2,388,084,427 |
| 22301 | 500,000,000 | 324,324,176 | 280,000,000 | 393,257,937 | 1,000,000,000 | 481,189,081 |
| 22401 | 510,000,000 | 224,908,300 | 370,000,000 | 377,120,448 | 1,739,000,000 | 576,211,703 |
| 22501 | 1,580,000,000 | 882,620,143 | 1,200,000,000 | 1,265,151,467 | 5,120,000,000 | 2,391,830,785 |
| 22601 | 29,000,000 | 26,548,106 | 21,000,000 | 28,054,748 | 154,000,000 | 126,459,768 |
| 22701 | 21,000,000 | 19,396,062 | 12,000,000 | 18,811,626 | 95,000,000 | 43,637,245 |
| 29101 | 14,000,000 | 8,261,589 | 7,000,000 | 12,952,277 | 59,000,000 | 35,094,208 |
| 32001 | 175,000,000 | 156,977,380 | 160,000,000 | 155,444,169 | 75,000,000 | 7,599,074 |

## 2.3.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවක් විසින් වාණිජ අත්තිකාරම් ගිණුම ක් පවත්වා තිබුණි.

**(අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවකට අදාල වාණිජ අත්තිකාරම් ගිණුමක් වෙනුවෙන් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | | බැරකම් ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 22302 | 535,000,000 | 305,776,657 | 540,000,000 | 597,423,117 | 450,000,000 | 691,413 | - | - |

**(ආ) මූල්‍ය ප්‍රතිඵල**

වාණිජ අත්තිකාරම් ගිණුමේ මූල්‍ය ප්‍රතිඵල පහත පරිදි විය.

| විෂය අංකය | අත්තිකාරම් ගිණුම් කටයුත්ත | මූල්‍ය ප්‍රතිඵල | | | |
|---|---|---|---|---|---|
| | | 2013 | | 2012 | |
| | | ලාභය/(පාඩුව) කල්පිත ගාස්තු රහිතව | ලාභය/(පාඩුව) කල්පිත ගාස්තු සහිතව | ලාභය/(පාඩුව) කල්පිත ගාස්තු රහිතව | ලාභය/(පාඩුව) කල්පිත ගාස්තු සහිතව |
| | | රු. | රු. | රු. | රු. |
| 22302 | ගබඩා අත්තිකාරම් (පුපුරණ ද්‍රව්‍ය) | 97,316,232 | 79,320,690 | 124,278,407 | 100,441,226 |

## 2.4 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### 2.4.1 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 08 ක 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම්වල ශේෂ එකතුව රු.18,728,699,352 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුමේ අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 7002/0000/00/0027/0013/000 | 17,343,327,720 |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | 7002/0000/00/0028/0013/000 | 584,204,663 |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | 7002/0000/00/0029/0013/000 | 634,121,615 |

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 7002/0000/00/0030/0013/000 | 2,062,817 |
| පොලිස් දෙපාර්තමේන්තුව | 7002/0000/00/0031/0013/000 | 137,026,985 |
| ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | 7002/0000/00/0032/0013/000 | 223,725 |
| වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 7002/0000/00/0091/0013/000 | 14,668 |
| සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | 7002/0000/00/0396/0013/000 | 27,605,719 |
| ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව | 7002/0000/00/0409/0013/000 | 111,440 |
| | | -------------------- |
| **එකතුව** | | **18,728,699,352** |
| | | ========== |

**2.4.2** **පොදු තැන්පත් ගිණුම**

-----------------------

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 09 ක 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. 3,694,939,976 ක් විය. විස්තර පහත දැක්වේ.

| **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **ගිණුම් අංකය** | **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|---|
| --------------------- | --------------- | ----------------------------- |
| | | **රු.** |
| රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 6000/0000/00/0015/0017/000 | 2,522,992,623 |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | 6000/0000/00/0015/0103/000 | 301,553,412 |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | 6000/0000/00/0015/0104/000 | 321,171,273 |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 6000/0000/00/0015/0105/000 | 27,844,731 |
| පොලිස් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0106/000 | 237,991,086 |
| ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0107/000 | 743,147 |
| පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0108/000 | 3,332,826 |
| වෙරළ සංරක්ෂණ | 6000/0000/00/0015/0146/000 | 16,772,351 |
| දෙපාර්තමේන්තුව | 6000/0000/00/0001/0024/000 | 10,924,792 |
| සිවිල් ආරක්ෂක | 6000/0000/00/0015/0166/000 | 150,238,327 |
| දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0196/000 | 101,187,156 |
| ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0171/000 | 188,252 |
| | | ------------------ |
| **එකතුව** | | **3,694,939,976** |
| | | ========= |

## 2 කොටස

**එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

### 1. ශීර්ෂය 103 - රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

#### 1.1 විගණන විෂය පථය

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 12 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

#### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

#### 1.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන

මෙහි (අ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| තොග ලේඛන | මුදල් රෙගුලාසි 715 (ඉ) |

**(ආ) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 10 ක් සඳහා සළසා තිබුණු රු.2,320,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 112 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) අතුරු අග්‍රිම නිරවුල් කිරීම**

නියැදි විගණන පරීක්ෂණයේ දී අනාවරණයවූ අඩුපාඩු කිහිපයක් පහත දැක්වේ.

* මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමයන් නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 50 කදී නිකුත් කළ එකතුව රු.1,753,177 ක තත් කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්ය නිම කර මාස 1 ත් මාස 5 අතර කාල පරාසයක ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි. අවස්ථා 02 කදී නිකුත් කර තිබුණු එකතුව රු.13,000 ක තත්

කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්යයට උපයෝගීකර නොගෙන පිළිවෙලින් දින 07 ක් හා දින 38 ක් අත රදවා ගෙන මුළු අතුරු අග්‍රිම මුදලින් ආපසු පියවා තිබුණි.

* නිලධාරීන් විසින් අතුරු අග්‍රිම ලබා ගැනිමේදී අදාල කාර්යය සඳහා අවශ්‍ය වන මුදල් ප්‍රමාණය අධි ඇස්තමේන්තු කර අවස්ථා 05 කදී ලබාගෙන තිබුණු අතර අදාළ කාර්යය සඳහා වියදම් කිරීමෙන් පසු ඉතිරි මුදල් දින 08 ත් මාස 02 ත් අතර කාල පරාසයක් තුළ අත රඳවා ගැනීමෙන් පසු පියවා තිබුණි. ආපසු පියවන ලද මුදල ලබාගත් අතුරු අග්‍රිමයෙන් සියයට 21 ත් සියයට 64 ත් අතර පරාසයක පැවතුණි.

**(ii) මතභේදයට තුඩුදෙන පරිදි අග්‍රිම ලබාදීම**

-----------------------------------------------

හෝටල් කර්මාන්තය දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය පිහිටි ඉඩම සමාගම් දෙකකට විකුණා ලද රු.19,817,306,000 ක් වූ මුදල, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාවට පටහැනිව මහා භාණ්ඩාගාරය විසින් 2011 අප්‍රේල් 05 දින රු.5,000,000,000 ක්ද, 2011 අප්‍රේල් 06 දින රු.8,820,250,000 ක්ද සහ 2011 අප්‍රේල් 21 දින රු.5,997,056,000 ක්ද වශයෙන් අමාත්‍යාංශ ලේකම්වරයා වෙත ලබා දි තිබුණි. එම මුදල බැංකු ජංගම ගිණුමක තැන්පත් කර පසුව භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර පොලී උපයමින් අකුරේගොඩ ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීම සඳහා වැය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | උපයන ලද පොලී ආදායම | ආරක්ෂක මූලස්ථානය ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල | වර්ෂය අවසානයේදී අත රඳවා ගත් මුදල |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2011 | 894,171,277 | 336,525,195 | 20,280,812,776 |
| 2012 | 2,008,077,222 | 1,866,056,958 | 20,517,173,852 |
| 2013 | 1,683,933,947 | 4,860,260,731 | 17,343,327,719 |

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වෙනත් අමාත්‍යාංශයක් සහ දෙපාර්තමේන්තුවක් විසින් විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.345,025 ක් අදාල කාර්යභාරයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ii) අමාත්‍යාංශයට නිශ්චිත කාර්යන් ඉටුකර ගැනීම සඳහා විවිධ පෞද්ගලික ආයතන වලින් ලැබි තිබුණු රු.12,788,490 ක් එම නිශ්චිත කාර්යයන් ඉටුකර ගැනීම සඳහා භාවිතා නොකර බැංකු ජංගම ගිණුමක වර්ෂ 1 සිට වර්ෂ 2 දක්වා කාල පරාසයක් නිෂ්ක්‍රීයව රඳවාගෙන තිබුණි.

**(ඉ) ආදායම් ගිණුම**

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 1 ත් වර්ෂ 4 ත් අතර කාල පරාසයක සිට හිඟහිටව පැවතුණු එකතුව රු.1,268,650 ක ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දූර්වල තත්ත්වයක පැවතුණි.

(ii) 2002 ජුලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ආර්ථික කටයුතු චක්‍රලේඛයේ 4(4) ඡේදය ප්‍රකාරව සෑම ආදායම් ගණන්දීමේ නිලධාරියෙකු විසින්ම හිඟ ආදායම් තවදුරටත් එකතුවීම වැලැක්වීම සඳහා නිසි අවධානයක් යොමු කළ යුතු බවත් මුදල් රෙගුලාසි 127(6) අනුව ආදායම් ගණන්දීමේ නිලධාරියෙකු විසින් රජයට ලැබිය යුතු ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයට භාජනය කළ යුතු බවත් දක්වා තිබුණද, ගිනි අවි සඳහා කාලීනව බලපත්‍ර අලුත් කිරීම, හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සහ පසු විපරම් ක්‍රියා පටිපාටි තුළින් බලපත්‍ර රහිත ගිනි අවි තබා ගැනීම අවම කිරිම සඳහා අමාත්‍යාංශය විසින් ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) ඉහත (ii) හි සඳහන් චක්‍රලේඛයේ 5 ඡේදයේ දැක්වෙන පරිදි ආර්ථික තත්ත්වයේ වෙනස්කම් සැලකිල්ලට ගනිමින් නොයෙකුත් සේවාවන් සඳහා අයකරනු ලබන ගාස්තු කාලානුරූපීව සංශෝධනය කළ යුතු වුවද, 1996 අංක 22 දරන තුවක්කු

(සංශෝධන) පනත යටතේ අයකරනු ලබන තුවක්කු බලපත්‍ර ගාස්තු සහ පුපුරණ ද්‍රව්‍ය සංශෝධන පනත යටතේ අයකරනු ලබන පුපුරණ ද්‍රව්‍ය සඳහා බලපත්‍ර ගාස්තු 1996 සහ 2000 යන වර්ෂවලින් පසුව සංශෝධනය කර නොතිබුණි. ඒ අනුව වර්තමානයේ අයකරනු ලබන ගාස්තු පිළිවෙලින් වර්ෂ 17 කට සහ වර්ෂ 13 කට පෙර තීරණය කළ ගාස්තු වන අතර ඒවා සංශෝධනය කිරීම පිළිබඳ අමාත්‍යාංශයේ අවධානය යොමුවී නොතිබුණි.

(iv) වර්ෂයේ ශුද්ධ ආදායම අමාත්‍යාංශයේ පොත්වල වාර්තා කිරීමේදී එක් එක් වර්ෂයට අදාල ආදායම සහ ඊට පෙර වර්ෂවල හිඟ ආදායමින් රැස්කරන ලද ආදායම වෙන වෙනම දැක්වෙන පරිදි වාර්තා පවත්වා නොතිබුණි. ඒ නිසා වාර්ෂික ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය හා හිඟ ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය පිළිබඳ සමාලෝචනය කළ නොහැකි විය.

**(ඊ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂයය අංක 10301 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිටව තිබුණු ශේෂවල එකතුව රු.18,462,440 ක් වූ අතර එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

(ii) 2013 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය විසින් පිළියෙල කර තිබුණු පාලන ගිණුමේ දැක්වෙන ශේෂය සහ කේවල ශේෂ ලැයිස්තුවේ දැක්වෙන ශේෂය අතර රු.475,136 ක වෙනසක් නිරීක්ෂණය විය.

(iii) 2004 නොවැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව නිලධාරියෙකු ස්ථාන මාරු වීම් ලබා මාස 03 ක් ගතවීමට පෙර මාසික ගිණුම් සාරාංශ මඟින් එම නිලධාරියාගේ ණය ශේෂ පියවා ගත යුතු වුවද 2005 වර්ෂයේ සිට 2013 වසර දක්වා කාලපරිච්ඡේදය තුළ ස්ථාන මාරු වීම් ලැබූ නිලධාරීන් 15 දෙනෙකුගෙන් අයවිය යුතු රු.686,835 ක ණය ශේෂ ඒ අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) 2013 දෙසැම්බර් 31 දිනට රු.12,358,659 ක්වූ හිඟහිටි ණය ශේෂ 511 ක් පැවති අතර එයින් එකතුව රු.7,571,873 ක් වූ ණය ශේෂ 366 ක් වර්ෂ 05 කට අධික කාලයක සිට පැවැත එන ශේෂ විය.

**1.4 යහපාලනය හා ගිණුම්කටයුතු භාවය**

---------------------------------------

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

--------------------------------

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 1.4.1 ජේදය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**1.5 අනුකූල නොවීම්**

-------------------

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.**

----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (අ) මුදල් රෙගුලාසි 210(1) | 88,711 | වට්ටම් ලබාගත හැකි සෑම අවස්ථාවකදීම වට්ටම් ලබාගැනීමට හැකිවනු පිණිස කල් ඇතිව ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු වුවද, අමාත්‍යාංශය විසින් ජල බිල්පත් එපරිදි නිරවුල් කර නොතිබීම හේතුවෙන් වට්ටම් අහිමිවී තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 218(2) | 2,061,338 | විධිවිධාන සළසා ඇති අවස්ථාවලදී හැර අන් සෑම අවස්ථාවකදීම මුදල් වර්ෂය ඇතුළත හිමිකම් පෑම් එම වර්ෂය ඇතුළතදීම ගෙවා බේරුම් නොකිරිම නිසා හිඟ විදුලි බිල්පත් සඳහා ලංකා විදුලිබල මණ්ඩලයට පොළී ගෙවා තිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 211 (1) හා 115 | 184,283 | 2012 ජුලි, අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල බිල්පත් රාශියක් එම වර්ෂයේදිම ගෙවිම් කර අවසන් නොකිරිම නිසා සමාලෝචිත වර්ෂයේදී එම ගෙවිම් බේරුම් කර තිබුණි. ඒ සඳහා මුදල් රෙගුලාසි 115 ප්‍රකාරව අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 137 (6) | 64,463 | අමාත්‍යාංශය විසින් විදුලි බිල්පත් ගෙවීමේදී අදාල මාසයේ විදුලි බිල්පතේ වටිනාකම ඉක්මවා ගෙවීම් කළ අවස්ථා 80 ක් විය. |

## 1.6 අවිධිමත් ගනුදෙනු

----------------------

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වු එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1(ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රති ඇණවුමක් මඟින් මිලදී ගැනීමේදී එසේ මිලට ගන්නා වටිනාකම මුල් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 50 ක් ඉක්මවිය නොහැකි වුවද, රු.384,000 ක් වැයකර ප්‍රති ඇණවුම් කිරීම මඟින් පරිගණක යන්ත්‍ර 4 ක් මිලට ගැනීමේදී ප්‍රති ඇණවුම් වටිනාකම මුල් කොන්ත්‍රාත් මිලෙන් සියයට 50 ක සීමාව ඉක්මවා තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශයේ දැක්වෙන පරිදි වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ ලංසු කැඳවීම් සිදුකරන විට ලංසු ඉදිරිපත් කිරීම සඳහා සැපයුම්කරුවන් හට අවම වශයෙන් දින 07 ක් ලබා දිය යුතු විය. ආරක්ෂක සේවා විද්‍යාලය පින්තාරු කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලට ගැනීම සඳහා ලංසු කැඳවීමේදී සැපයුම්කරුවන් විසින් ලංසු ඉදිරිපත් කළ යුතු අවසාන දිනය සඳහන් නොකර ලංසු හැකි ඉක්මනින් එවන ලෙස දන්වා තිබුණි. ඒ අනුව ලංසුකරුවන්ට සාධාරණ කාලයක් ලබා දී කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු බව විගණනයේදී තහවුරු වී නොතිබුණි

## 1.7 අනාර්ථික ගනුදෙනු

--------------------

පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව සඳහා 2013 නොවැම්බර් 01 දින සාරි 400 ක් මිලදී ගෙන තිබුණු අතර ඉන් රු.217,800 ක් වටිනා සාරි 44 ක් භාවිතා කිරීමකින් තොරව ගබඩාවේ නිෂ්කාර්යව පැවැතුණි.

## 1.8 කළමනාකරණ දුර්වලතා

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශයේ වැටුප් පිළියෙල කිරීමේ හා ගෙවීම් කිරීමේ අභ්‍යන්තර පාලනය දුර්වලවීම නිසා රාජ්‍ය බුද්ධි සේවයේ වැටුප් සකස් කළ නිලධාරියා විසින් රු.580,891 ක් මාස 03 ඇතුළතදී වංචා කර තිබුණි.

(ආ) අමාත්‍යාංශ ගබඩාවේ තිබුණු රු.57,181 ක් වටිනා තීන්ත තොගයක් කල් ඉකුත් වී තිබුණි.

(ඇ) රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ 2013 වර්ෂයේ මූල්‍ය බලතල පැවරීම යටතේ ජාතික ශිෂ්‍යභට බලකායේ අධ්‍යක්ෂවරයාට රු.100,000 ක සීමාවක ගෙවීම් අනුමත කිරීම සඳහා බලතල පවරා තිබුණි. එම සීමාව ඉක්මවන ගනුදෙනු කිහිපයක් ආසන්න දිනයන්වලදී කොටස් වශයෙන් සිදු කර බිල්පත් කිහිපයකින් ගෙවීම් කර තිබුණි. ඒ අනුව මුළු වටිනාකම රු.1,887,799 ක් වූ ඉංජිනේරු ද්‍රව්‍ය, ලිපිද්‍රව්‍ය සහ පිහන් භාණ්ඩ මිලදී ගෙන තිබුණු එවැනි අවස්ථා 10 ක් නියැදි විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. මෙලෙස එකම භාණ්ඩය කොටස් වශයෙන් මිලදී ගැනීම නිසා ලබාගත හැකිව තිබුණු වෙළඳ වට්ටම් අහිමි වී තිබුණු බවත් එකම භාණ්ඩය එකම මිලට මිලදී ගැනීම සඳහා නිතර නිතර මිල ගණන් කැඳවීමට සහ අදාල ලිපි කටයුතු සඳහා අනවශ්‍ය පිරිවැයක් දැරීමට සිදුවී ඇති බවත් නිරීක්ෂණය විය.

(ඇ) පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවට අදාල වියදම් දැරීම සඳහා රු.234,000,000 ක පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මහා භාණ්ඩාගාරය විසින් ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදන අනුමත කළ කාර්යය සඳහා පමණක් උපයෝජනය කළ යුතු බවට ප්‍රතිපාදන ලබා දුන් ලිපියේ සඳහන් කර තිබුණි. එහෙත් පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවේ අවශ්‍යතා ලෙස සඳහන් කරමින් තෝරාගත් සැපයුම්කරුවන්ට ඇණවුම් ඉදිරිපත් කර තිබුණු රු.1,342,207 ක් වූ භාණ්ඩ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය වෙත සමුළුව අවසන් වීමෙන් පසුව ලැබී තිබුණු අතර එම භාණ්ඩ සමුළුවේ අවශ්‍යතාවය වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.

(i) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලයේ ලාංඡනය සහිත කොඩි 15 ක් අවිධිමත් ලෙස රු.137,500 කට මිලදී ගෙන තිබුණි. එම අවිධිමත් ස්වභාවය ලියවිලිවලින් සනාථ නොවන පරිදි අදාල ලියකියවිලි සකස් කර ගොනුවට ඇතුළත් කර තිබුණි.

(ii) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය විසින් පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව සඳහා රු.204,075 ක් වටිනා ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගෙන තිබුණි. එම මිලදී ගැනීම සඳහා මිල කැඳවීම් ලිපිවල දිනයන් වෙනස් කර තිබුණු බැවින් එම මිල කැඳවීම් පසුව ලබාගත් ඒවා බව තහවුරු විය.

(iii) රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද 2008 ජුනි 23 දිනැති අංක පිඑෆ්/එෆ්එස්/01 දරන ලිපිය මගින් ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය විසින් බාහිර පාර්ශවයන් සඳහා සපයන සේවාවන් මගින් උපයන ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කරන ලෙස දක්වා තිබුණ ද, අදාල ආයතන ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 1.9 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 61 | 44 | 17 | - |
| තෘතියික මට්ටම | 11 | 07 | 04 | - |
| ද්විතියක මට්ටම | 270 | 209 | 61 | - |
| ප්‍රාථමික මට්ටම | 151 | 136 | 15 | - |
| වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 08 | - | 08 |
| එකතුව | 493 | 404 | 97 | 08 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 97 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ii) බඳවාගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබාගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

**(ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත් පිළිබඳ අනාවරණය වු කරුණු පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| ප්‍රාථමික මට්ටම් | 29 | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | 2012 වර්ෂයේ සිට මේ දක්වා |
| ප්‍රාථමික මට්ටම් | 01 | ශ්‍රී ලංකා ජාතික ජලජීවි වගා සංවර්ධන අධිකාරිය | 2005 වර්ෂයේ සිට මේ දක්වා |

උක්ත මානව සම්පත් වෙනුවෙන් වැටුප් හා වේතන ඔවුන් අයත් ආයතන විසින් ගෙවා තිබුණත්, සේවාව අමාත්‍යාංශය විසින් ලබාගෙන තිබුණි.

## 2. ශීර්ෂය 222 - ශ්‍රී ලංකා යුද හමුදාව

---

### 2.1 විගණන විෂය පථය

---

ශ්‍රී ලංකා යුද හමුදාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 09 දින යුද්ධ හමුදාපති වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන් , රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2.3 විගණන නිරීක්ෂණය

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ශ්‍රී ලංකා යුද හමුදාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා ( ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අග්‍රිම ගිණුම්**

2014 අප්‍රේල් 30 දින වන විට ශ්‍රී ලංකා යුද හමුදාව විසින් පියවා නොතිබුණු අග්‍රිම ශේෂය රු.100,593,624 ක් වී තිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 22201 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.297,447,366 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 2.4 වත්කම් කළමනාකරණය

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ගකර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| (i) | ගොඩනැගිලි | 05 | කාල සීමාවක් දක්වා නොමැත |
| (ii) | මෝටර් වාහන | 365 | එම |
| (iii) | යන්ත්‍ර සූත්‍ර | 05 | එම |
| (iv) | ටයර් | 1,389 | අවුරුදු 05 කට වැඩි |
| (v) | ටියුබ් | 4,170 | අවුරුදු 05 කට වැඩි |
| (vi) | බැටරි | 287 | අවුරුදු 05 කට වැඩි |

## 2.5 අනුකූල නොවීම්

**(අ) නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම .**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 94 | 2,051,103,987 | සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 104(1) | 3,103,554,519 | හානි 164 කට අදාළ වටිනාකම ගණනය කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට 2013 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. |

**(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම.**

ශ්‍රී ලංකා යුද හමුදාව විසින් 2011 වර්ෂයේ දී A4 වර්ගයේ ජායා පිටපත් කඩදාසි සහ Lexmark වර්ගයේ පරිගණක රිබන් මිලදී ගැනීම වෙනුවෙන් එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා ලියාපදිංචි නොවු සැපයුම්කරුවකු වෙත රු.1,091,250 ක් එකතු කළ අගය මත බදු වශයෙන් ගෙවා තිබුණි. එම මුදල සැපයුම්කරු විසින් වංචා සහගත ලෙස රඳවා ගෙන තිබුණු බව අනාවරණය විය.

**2.6 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

-----------------------------------

2011 දෙසැම්බර් 03 දින සහ 06 දින ගබඩාවට ලැබුණු බව සඳහන් A4 වර්ගයේ කඩදාසි පැකට් 11,750 ක තොගය ගබඩාවට ලැබුණු බව ගබඩා ලෙජරය අනුව තහවුරු නොවිය.

**2.7 අවිධිමත් ගනුදෙනු**

---------------------

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැරවීම.**

---------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4 (ඊ) මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු ඉදිරිපත් කිරීමේ නියමිත ලේඛන මත සැපයුම්කරු විසින් ලංසු ඉදිරිපත් කළ යුතු වුවත් A4 වර්ගයේ ඡායා පිටපත් කඩදාසි මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීමේ දී ලංසු ඉදිරිපත් කිරීමේ නියමිත ලේඛන මත ලංසු ඉදිරිපත් නොකළ ලංසුකරුවෙකුගෙන් රු.8,400,000 ක් වටිනා කඩදාසි පැකට් 20,000 ක් මිල දී ගෙන තිබුණි.

(ii) ඉහත ලංසුකරු ප්‍රසම්පාදන පත්‍රිකාව සමඟ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ඉදිරිපත් කර නොතිබුණ ද එම ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(iii) 2011 වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අනුව A4 වර්ගයේ කඩදාසි අවශ්‍යතාවය පැකට් 30,000 ක් වුවත් එම ප්‍රමාණය අභිබවා කඩදාසි පැකට් 21,500 ක් මිලට ගෙන තිබුණි.

**2.8 කළමනාකරණ දුර්වලතා**

-----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා යුද හමුදා යුද්ධෝපකරණ බලකායේ පනාගොඩ අංක 02 ටයර් හා ටියුබ් ගබඩාවේ සිදුකළ භෞතික පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ටයර් වර්ග 11 ක ඌණතාවයක් සහ ටයර් වර්ග 27 ක අතිරික්තයක් විය. එහි වටිනාකම පිළිවෙලින් රු.4,754,170 ක් සහ රු.2,272,619 ක් වී තිබුණි.

(ii) ගබඩාවෙහි සියළුම ටයර් ඇතුළත් තොග පොතක් පවත්වා නොතිබුණු අතර රු.1,543,536 ක් වටිනා ටයර් 216 ක් වෙනුවෙන් ගබඩාවේ බින්කාඩ් පවත්වා නොතිබුණි.

(iii) වටිනාකම රු.1,175,515 ක් ටියුබ් 1,040 ක ඌණතාවයක් ද වටිනාකම රු.1,784,769 ක් වූ ටියුබ් 1,583 ක අතිරික්තයක්ද විය.

(iv) ගබඩා පාලනය හා අධීක්ෂණය ඉතා දුර්වල මට්ටමක පැවැතුණි.

(ආ) මරදාන මූලික යුද්ධෝපකරණ ගබඩාවේ සිදුකරන ලද භෞතික පරීක්ෂාවේ දී රු.1,972,331 ක් වටිනා ටයර් 194 ක අතිරික්තයක් සහ රු.153,568 ක් වටිනා ටයර් 15 ක ඌනතාවයක් විය.

(ඇ) 2011 මැයි 27 දින පැවති විජයග්‍රහණ පෙළපාලිය සඳහා හදිසි අවශ්‍යතාවයක් සේ සළකා ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බල මුළුව විසින් තූර්ය වාදක භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කර තිබුණද, සැපයුම්කරු එම භාණ්ඩ එම පෙළපාලිය පැවැති දිනයට පසු එනම් 2011 සැප්තැම්බර් 09 දින සපයා තිබුණි.

## 2.9 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව සහ තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

(අ) **සිවිල් කාර්ය මණ්ඩලය**

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 10 | 10 | - | - |
| (ii) | තෘතියීක මට්ටම | 06 | 02 | 04 | - |
| (iii) | ද්විතියක මට්ටම | 198 | 133 | 65 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 6,387 | 7,008 | - | 621 |
| (v) | වෙනත් (කොන්ත්‍රාත් පදනම) | 4,537 | 3,652 | 885 | - |
| | **එකතුව** | 11,138 | 10,805 | 954 | 621 |

**(ආ) නිල ඇඳුම් කාර්ය මණ්ඩලය**

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ | 8,019 | 7,946 | 73 |
| (ii) | තෘතියික | 92,023 | 91,875 | 148 |
| (iii) | ද්විතියක | 100,305 | 84,135 | 16,170 |
| | **එකතුව** | **200,347** | **183,956** | **16,391** |

## 3. ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාව

### 3.1 විගණන විෂය පථය

ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 12 දින නාවික හමුදාපති වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 3.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**3.3 විගණන නිරීක්ෂණය**

**----------------------**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ශ්‍රී ලංකා නාවික හමුදාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (උ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 3.4 සිට 3. 09 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---------------------------------------------

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**(ආ) විගණන සාක්ෂි නොවීම**

-----------------------------

**විගණන විමසුම්වලට පිළිතුරු දීම.**

--------------------------------------

බාහිර පාර්ශවයන්ට සේවා සැපයීමෙන් උපයන ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර නොකිරීම සම්බන්ධයෙන් 2014 ඔක්තෝබර් 29 දින නිකුත් කරන ලද විගණන විමසුමට 2015 ජනවාරි 31 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) අයවැය විචලනය**

---------------------

වැය විෂයයන් 33 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ත් සියයට 99 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඈ) අග්‍රිම ගිණුම්**

--------------

මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම තත් කාර්යය අතුරු අග්‍රිම නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 20 කදී ලබා දී තිබුණු තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමවී මාස 03 සිට මාස 09 දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම**

**----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 571(අ) ප්‍රකාරව සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම ඉකුත් තැන්පතු පිළිබඳව ලැයිස්තු පිළියෙල කර නොතිබුණි.

(ii) කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් රඳවාගෙන තිබුණු එකතු රු.449,861 ක තැන්පතු කල් ඉකුත් වී තිබුණත්, එම තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii) ව්‍යාපෘති අරමුදල් සඳහා වු එකතුව රු.293,700 ක තැන්පතු මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව ව්‍යාපෘතිය නිමවී වර්ෂ 2 ක් ඉක්ම ගිය පසු රජයේ ආදායමට බැර කර නොතිබුණි.

**(ඊ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 22301 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව අයවීම් හිඟහිට තිබුණු ණය ශේෂවල එකතුව රු.18,098,810 ක් වූ අතර එම හිඟ හිටි ණය ශේෂවලින් රු.13,744,349 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර තිබුණ ද රු.4,354,462 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට අදාල තොරතුරු කිසිවක් ශ්‍රී ලංකා නාවික හමුදාව සතුව නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ කටයුතු සඳහා පවත්වා ගෙන යනු ලබන පොත් සහ ඊට අනුරූපීව භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන පොත් අතර රු.20,711 ක හඳුනාගත නොහැකි වෙනසක් වසර 13 ක කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවැතුණි.

(iii) ඉදිරිපත් කරන ලද සැසඳුම් ප්‍රකාශයේ දැක්වෙන පරිදි 2013 දෙසැම්බර් 31 දිනට පාලන ගිණුමේ ශේෂය සහ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව අතර රු.44,143,740 ක වෙනසක් පැවැතුණි. පසුගිය වර්ෂවලදී ද මෙවැනි වෙනස්කම් අනාවරණය වී තිබුණි.

**(උ) වාණිජ අත්තිකාරම් ගිණුම**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 වර්ෂයේදී විකුණුම් අත්තිකාරම් ලෙස අවස්ථා දෙකකදී ලැබී තිබුණු එකතුව රු.32,987 කට අදාලව 2013 වර්ෂයේ දී ඇණවුම් දෙකක් මගින් භාණ්ඩ විකුණා තිබුණත්, ඒවා විකුණුම් වශයෙන් ගිණුම්ගත නොකර තවදුරටත් විකුණුම් සඳහා ලද අත්තිකාරම් වශයෙන් ගිණුම්ගත කිරීම හේතු කොටගෙන සමාලෝචිත වර්ෂයේ විකුණුම් රු.32,987 කින් අඩුවෙන් සහ විවිධ ණයහිමියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) වාණිජ අත්තිකාරම් ගිණුමට අදාලව 2013 වර්ෂයේ දී ලබාගත් සේවාවන් වෙනුවෙන් ගෙවිය යුතු රු.988,855 ක් වූ වියදම් උපචිත පදනම මත ගිණුම්ගත

නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(iii) ජාතිය ගොඩනැගීමේ බදු ලෙස 2013 වර්ෂයේ අවසන් කාර්තුව සඳහා රු.1,255,340 ක් ගෙවා තිබුණත් එම බදු මුදල රු.1,405,981 ක් ලෙස ගිණුම්ගත කිරිම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.150,641 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබුණු 2011 සහ 2012 වර්ෂවලට අදාල රු.9,325,091 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු මුදල් සමාලෝචිත වර්ෂයේ වියදම් වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් ලාභය රු.9,325,091 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(v) 2013 දෙසැම්බර් 27 දින පොටෑසියම් ක්ලෝරේඩ් තොගයක් ගබඩාව වෙත ලැබී තිබුණි. එම මුළු තොගයම ගැණුම් වශයෙන් ගිණුම්ගත නොකර ඒ වෙනුවෙන් ණයවර ලිපි මඟින් ගෙවා තිබුණු රු.16,073,958 ක මුදල පමණක් ගැණුම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. අවසන් තොගය අගය කිරීමේ දී ගබඩාවට ලැබුණු මුළු තොගයම සැලකිල්ලට ගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය රු.10,710,617 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(vi) 1996 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා නිරවුල් නොකරන ලද එකතුව රු.99,789,112 ක් වූ ණයහිමි ශේෂ 2013 දෙසැම්බර් 31 දිනට වූ ශේෂපත්‍රයේ දක්වා තිබුණ ද එම ණයහිමි ශේෂය සනාථ කිරීමට අදාල ප්‍රභව ලියවිලි කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(vii) වාණිජ අත්තිකාරම් ගිණුමේ දෛනික විකුණුම්වලට අදාල සියළුම මුදල් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් රැස්කරන ලද දිනවලදීම ප්‍රේෂණය කර තිබුණත් 2013 දෙසැම්බර් 31 දිනට රු.1,202,449 ක් ශ්‍රී ලංකා නාවික හමුදාව ගෙවියයුතු බව ශේෂපත්‍රයේ දක්වා තිබුණි. එම වගකීම තහවුරු කිරීමට අදාල ලිඛිත සාක්ෂි කිසිවක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(viii) මුදල් රෙගුලාසි 504 ප්‍රකාරව වාණිජ අත්තිකාරම් ගිණුමක් සම්බන්ධයෙන් එක් එක් කාර්තුවක් අවසානයේදී පහත සඳහන් ප්‍රකාශ සහ වාර්තා පිළියෙල කර එම කාර්තුවට පසුව එළඹෙන මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත පිටපතක් සහිතව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කර නොතිබුණි.

- (i) වෙළෙඳ ණයහිමියන් පිළිබඳ ප්‍රකාශය
- (ii) තොග හා බඩුබාහිර පිළිබඳ මාසික පරීක්ෂණ වාර්තාව
- (iii) අත්තිකාරම් ගිණුම සඳහා නියමිත සීමාවන් දැක්වෙන ප්‍රකාශය
- (iv) අවස්ථානුකූල ලාභ ලාභ ගිණුම

(ix) 2011 අංක 10 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනතේ 4 වන වගන්තියට අනුව ඒ ඒ මාසයේදී එකතු කළ ජාතිය ගොඩනැගීමේ බදු මුදල් ඊළඟ මාසයේ 20 දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතුව තිබුණි. එසේ රැස්කළ රු.4,788,722 ක් වූ බදු මුදල් දින 08 සිට දින 163 ක් දක්වා වූ පරාසයක කාලයක් ප්‍රමාද කර ප්‍රේෂණය කර තිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

------------------------------

### (අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

--------------------------------------------

නාවික හමුදාවේ සියළුම ආයතන සහ නෞකාවන්ට අයත් ගිණුම් ඒකකයන් සහ ගණක ඒකකයන් ආවරණය වන පරිදි ඒ ඒ විධානයන් විසින් 2013 දෙසැම්බර් 05 දින පරීක්ෂණ මණ්ඩල පත්කර වාර්ෂික භාණ්ඩ පරීක්ෂණ සිදුකරන ලද බව 2014 මාර්තු 25 දිනැති අංක SSO(SM) 03/2014 දරන ලිපිය මගින් විගණකාධිපති වෙත දැනුම් දී තිබුණි. 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 31 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් 2014 නොවැම්බර් 30 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පහත සඳහන් වාහන අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණි.

| බාහිර පාර්ශවය | වත්කම් වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| ජනාධිපති ලේකම් කාර්යාලය | වාහන | 02 |
| අමාත්‍යවරයෙකුට | වාහන | 01 |
| විශ්‍රාමික අද්මිරාල්වරුන් දෙදෙනෙකුට | වාහන දෙකක් හා යතුරු පැදියක් | 03 |
| ආරක්ෂක ලේකම්වරයාගේ සම්බන්ධීකරණ ලේකම් | වාහන | 01 |
| විශ්‍රාමික මේජර් ජෙනරාල්වරයෙකුට | වාහන | 01 |
| ආරක්ෂක සේවා විද්‍යාලය | වාහන | 01 |
| ආරක්ෂක අමාත්‍යාංශයේ මාධ්‍ය මධ්‍යස්ථානයට | වාහන | 01 |

## 3.5 අනුකූල නොවීම

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (අ) මුදල් රෙගුලාසි 210 (1) | 853,353 | වට්ටමක් ලබාගත හැකි සෑම අවස්ථාවකදීම එම වට්ටම ලබාගත හැකි වන පරිදි ජල බිල්පත් ගෙවා නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 1645 | - | සංචිත වාහනවල දෛනික ධාවන සටහන් පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 3.6 අවිධිමත් ගනුදෙනු

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.1 (අ) මාර්ගෝපදේශය සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ ලංසු කැඳවීමේ ලේඛනයේ අඩංගු රෙගුලාසිවලට පටහැනි අයුරින් ෆැක්ස් මඟින් එවන ලද මිල ගණන්වලට අනුව රු.262,752 ක වටිනාකමකින් යුත් ගම්බෝතල් ද, කුලී පදනම මත වාහන හා රු.656,560 ක් වටිනා දැව තොගයක්ද මිලදී ගෙන තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11(ආ)(iii) මාර්ගෝපදේශය අනුව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු ලැබුවහොත් සැපයුම ප්‍රතික්ෂේප කිරීම වැලැක්වීම පිණිස මිල ගණන්වල වලංගු කාලය ආවරණය වන පරිදි ලංසුකරුගෙන් ලංසු සුරක්ෂණයක් ලබාගත යුතු වුවද, රු.20,373,849 ක වටිනාකමකින් යුත් භාණ්ඩ මිලදී ගැනීමේදී ලංසු සුරක්ෂණ ලබාගෙන නොතිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී කාර්යසාධන සුරක්ෂණ ලබාගත යුතු වුවද රු.10,361,473 ක් සහ රු.8,109,477 ක වටිනාකම්වලින් යුත් කොන්ත්‍රාත්තු පිරිනැමීමේදී කාර්යසාධන සුරක්ෂණ ලබාගෙන නොතිබුණි.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1(අ) මාර්ගෝපදේශයට පටහැනි අයුරින් ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා රු.1,729,858 ක් වටිනා නාන කාමර කට්ටල මිලට ගැනීමට කටයුතු කර තිබුණි. 2012 ඔක්තෝබර් 6 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටුව ලබාදුන් නිර්දේශයන්ට අනුව 2013 අප්‍රේල් 9 දින ඇණවුම් ඉදිරිපත් කිරීමේ හේතුවෙන් 2014 අප්‍රේල් දක්වාම සැපයුම්කරු විසින් භාණ්ඩ සපයා නොතිබුණි.

(v) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ආරාධිත ලංසුකරුවන් කීපදෙනෙකුගෙන් ලබාගත් මිල සැඳහුම් සසඳා අදාල සැපයුම්කරු තෝරාගත යුතු වුවත්, ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් රු.1,025,949 ක වටිනාකමකින් යුතු වෛද්‍ය උපකරණ සඳහා ලැබුණු එකම ලංසුව පදනම් කරගෙන මිලදී ගෙන තිබුණි.

(vi) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) මාර්ගෝපදේශයට අනුව රු.500,000 ක් ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් ගිවිසුමක් අත්සන් කළ යුතු වුවද, ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා කුලී පදනම මත වාහන ලබාගැනීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**(ආ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

---------------------------------------

2009 ජනවාරි 23 දිනැති අංක MOD/FD/IA/5/3/(2) දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව 2009 පෙබරවාරි 03 දින ගරු ජනාධිපතිතුමා විසින් බාහිර පාර්ශවයන්ගෙන් ලැබෙන ආදායම් අරමුදල් ගිණුම්වලට ''බැර'' කිරීම ප්‍රතික්ෂේප කර තිබුණු අතර ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක FD/IA/05/03/02 දරන 2009 නොවැම්බර් 11 දිනැති ලිපියට අනුවද මෙම ආදායම් සියල්ල අරමුදල් ගිණුම්වලට ''බැර'' නොකර ඒකාබද්ධ අරමුදලට ''බැර'' කළ යුතු බව අවධාරණය කර තිබුණි. තවද ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 දෙසැම්බර් 09 දිනැති අංක ආ/IV/5/4-11 දරන ආරක්ෂක ලේකම් අමතන ලද ලිපිය මගිනුත් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2008 ජුනි 23 දිනැති

අංක PF/FS/01 දරන රාජ්‍ය ආරක්ෂක ලේකම් අමතන ලිපිය මගිනුත් ත්‍රිවිධ හමුදාව විසින් බාහිර පාර්ශවයන්ගෙන් උපයනු ලැබූ ආදායම්, රජයේ ඒකාබද්ධ අරමුදලට "බැර" කළ යුතු බව සඳහන් කර තිබුණද එපරිදි කටයුතු නොකර, ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් උපයන ආදායම් විවිධ අරමුදල් ගිණුම්වලට "බැර" කර අධිකාරී බලයකින් තොරව වියදම් කර තිබුණි. විවිධ ක්‍රමවේදයන් රාශියක් තුළින් මෙවැනි ආදායම් උපයන අතර ඒ සඳහා වෙන වෙනම ගිණුම් නඩත්තු කරන බවද විගණනයට නිරීක්ෂණය වූ නමුත් එම ආදායම් පිළිබඳ කිසිදු තොරතුරක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 3.7 පාඩු හා හානි

-----------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා ගියර් බොක්ස් අමතර කොටස් මිලදී ගැනීමේදී ප්‍රථමයෙන් ලද මිල ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කර ඇගයීමක් ලබාගැනීමට කටයුතු නොකර නැවතත් මිල ගණන් කැඳවා මිලදී ගැනීම නිසා ඒකාබද්ධ අරමුදලින් රු.853,444 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා අවශ්‍ය ප්ලයිවුඩ් දොරවල් 137 ක් මිලදී ගැනීමේදී ගිවිසුම්ගත සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ මිලදී ගැනීමට ක්‍රියා නොකිරීමේ හේතුවෙන් ඒකාබද්ධ අරමුදලින් රු.159,662 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) ගිවිසුම්ගත සැපයුම්කරුවන්ගෙන් මිලදී නොගෙන පරාක්‍රම කඳවුර වෙත ලබා දී තිබුණු සුළු මුදල් අග්‍රිමයෙන් 2013 ජනවාරි මාසයේ සිට 2013 ජූලි මාසය දක්වා කාලය තුළ රු.2,348,699 ක වටිනා ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම නිසා රු.595,758 ක් වැඩිපුර ගෙවා තිබුණි

(ඈ) ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් භාණ්ඩ මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීමෙන් පසු එකී මිල ගණන්වල වලංගු කාලය තුළ ඇණවුම ඉදිරිපත් කිරීමට කටයුතු නොකිරීම හේතු කොටගෙන විශාල වශයෙන් වැඩිකළ මිලක් ගෙවීමට සිදුවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(ඉ) ශ්‍රී ලංකා නාවික හමුදාව සතු වාහන 2 ක් අලුත්වැඩියා කිරීම සඳහා භාරදී තිබුණු ආයතනයේදීම එම වාහන දිරාපත්වී තිබුණද, එකී අලාභය කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.8 අනාර්ථික ගනුදෙනු**

------------------------

විදුලි බිල්පත්වලට නියමිත දිනයේදී මුදල් නොගෙවීම හේතුකොට ගෙන ලංකා විදුලි බල මණ්ඩලයට රු.8,341,685 ක මුදලක් දඩපොලී වශයෙන් ගෙවා තිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

**3.9 කළමනාකරණ දුර්වලතා**

--------------------------

ඉපලෝගම ඉදිකරන ලද සාප්පු සංකීර්ණය සඳහා රෝලර් ෂටර් දොරවල් මිලදී ගැනීමේදී භාණ්ඩ සැපයීමට පෙර සැපයුම්කරු වෙත මුදල් ගෙවීම හේතුකොටගෙන නියමිත මුදලට වඩා රු.189,868 ක මුදලක් සැපයුම්කරු වෙත ගෙවා තිබුණි. එම මුදල සැපයුම්කරු විසින් මාස 5 ක කාලයක් පරිහරණය කර ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ආපසු ගෙවා තිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

**4. ශීර්ෂය 224 - ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

--------------------------------------

**4.1 විගණන විෂය පථය**

---------------------

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 09 දින ගුවන් හමුදාපති වෙත නිකුත් කරන ලදී . ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 4.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 4.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (උ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 4.4 සිට 4.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ගුවන් හමුදාව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | | අදාල රෙගුලාසිය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | - | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක උපාංග සම්බන්ධ වත්කම් ලේඛන | - | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| බැරකම් ලේඛන | - | මුදල් රෙගුලාසි 214 |

**(ආ) විගණන සාක්ෂි නොවීම**

**-------------------------**

විසර්ජන ගිණුමේ ඇතුළත් කර තිබූ රු.4,278,066,950 ක බැරකම් ඒවාට අදාල ඉන්වොයිස් අංකවලට යොමුව දක්වමින් ලේඛනයක් ඉදිරිපත් කර නොතිබූ බැවින් ඒවායේ නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි විය.

**(ඇ) අයවැය විචලනය**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 12කට අදාලව ශුද්ධ ප්‍රතිපාදනය රු.15,829,125,000 ක් විය. සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.5,495,088,697 ක් උපයෝජනය කර තිබූ අතර රු.10,334,036,303 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. MI-17 ගුවන්යානා මිළදී ගැනීම සඳහා වැය කර තිබුණු රු.8,156,669,135 ක වියදම 224-1-3-2502 වැය විෂය යටතේ ගිණුම් ගත නොකිරීම නිසා වු ඉතිරිය ද එම ඉතිරි ප්‍රතිපාදනය තුළ ඇතුළත් වී තිබුණි.

(ii) වැය විෂයයන් 07 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් රු.2,972,600,000 ක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණු අතර ඉන් රු.241,248,978 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.2,731,351,022 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම් තුළ අවස්ථා 04 කදී පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරිම් යටතේ ලබාගත් රු.2,702,600,000 ක ප්‍රතිපාදන අදාල කාර්යය වෙනුවෙන් උපයෝජනය නොකර මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(iii) වැය විෂයයන් 29 කට සළසා තිබුණු රු.1,113,650,801ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී මුදල් රෙගුලාසි 66 ප්‍රකාර වෙනත් වැය විෂයයන් 06 කට මාරු කර තිබුණි. එම මාරු කිරීම්වලින් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා 224-1-3-2104 වැය විෂයයට රු.100,000,000 ක්වූ ප්‍රතිපාදන මාරු කර ගෙන තිබුණත්, ඉන් කිසිදු උපයෝජනයක් සමාලෝචිත වර්ෂයේදී සිදු කර නොතිබුණි.

(iv) ගුවන් හමුදාව විසින් පිළියෙල කර තිබූ 2012-2015 කාල පරිච්ඡේදයට අදාළ සංයුක්ත සැලැස්ම 2013 වර්ෂයේදී සංශෝධනය කර නොතිබුණි. එය පදනම් කරගෙන වාර්ෂික අයවැය ඇස්තමේන්තුව පිළියෙල කර නොතිබුණු අතර වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ පුරෝකථනයන්ට අනුකූල වන පරිදි ක්‍රියාකාරි සැලැස්ම සකස් කර නොතිබුණි. තවද ක්‍රියාකාරි සැලැස්මේ ඉලක්ක සපුරාලීම තහවුරු කිරීම සඳහා ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම**
**-------------**

2014 අප්‍රේල් 30 දින වන විට ගුවන් හමුදාව විසින් පියවා නොතිබුණු අග්‍රිම ශේෂ එකතුව රු. 2,047,167 ක් වී තිබුණි. ඉන් රු. 574,452 ක් 2001 වර්ෂයේ සිට භාණ්ඩාගාරයට පියවීමකින් තොරව පැවත එමින් තිබුණි. තවද පියවා නොතිබුණු අග්‍රිම ශේෂ සැකසී ඇති ආකාරය පිළිබඳ තොරතුරු විසර්ජන ගිණුමේ ඇතුළත් කර නොතිබුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම**
**------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 2 ක් ඉක්මවූ රු.3,916,564 ක්වූ තැන්පතු 06 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) 2013 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ කල් ඉකුත් වූ රු.1,331,571ක් වටිනා චෙක්පත් 15 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර රාජ්‍ය ආදායමට බැර නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**(ඊ) ආදායම් ගිණුම**
**----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගුවන් යානා කුලී ආදායම් රැස්කිරීමට අදාල ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් ගුවන් හමුදාපතිවරයාගේ සෘජු අධීක්ෂණය යටතේ මෙහෙයුම් කටයුතු කරනු වෙනුවට 2010 ජූනි මාසයේ ආරම්භ කර තිබූ පෞද්ගලික සමාගමක් මගින් ගුවන්යානා මෙහෙයුම් කටයුතු සිදුකිරීම නිසාත්, එමගින් වාර්තා පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම රජය මගින් නිකුත් කර තිබෙන චක්‍රලේඛ විධිවිධානවලට අනුව සිදුනොකිරීම නිසාත්, එම සමාගම මගින් කෙරෙන මෙහෙයුම් කටයුතුවලට අදාල ලේඛන හා කාර්යසාධන වාර්තා විගණකාධිපතිගේ අතුරු විගණනය කටයුතු සඳහා ඉදිරිපත් කර නොතිබුණු නිසාත් විගණන විෂය පථය සීමාවී තිබුණි.

(ii) මගීන් හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා ගුවන් යානා වෙන්කිරීම අන්තර්ජාලය හරහා ක්‍රෙඩිට් කාඩ් මගින් සිදුකිරීමේදී උක්ත පෞද්ගලික සමාගමේ බැංකු ගිණුම යොදාගෙන තිබුණු අතර එම බැංකු ගිණුමට අදාල විස්තර හා

රැස්කරණ කුලී ආදායම්වලට අදාල ප්‍රභව ලියවිලි හා අනෙකුත් ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. ඒ අනුව රැස්කළ ආදායම සහ හිග ආදායම ලෙස පිළිවෙලින් රු.202,791,651 ක් හා රු.28,985,823 ක් ආදායම් ගිණුමේ දක්වා තිබුණත්, එහි නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගැනිමට නොහැකි වී තිබුණි.

(iii) 2002 ජූලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ 4 (ඇ) ඡේදයට අනුව හා 2009 පෙබරවාරි 03 දිනැති අංක MOD/FD/IA/5/3/(2) දරන අමාත්‍ය මණ්ඩලයේ තීරණය අනුව ගුවන් හමුදාවේ භෞතික හා මානව සම්පත් යොදවා උපයන සෑම ආදායමක්ම ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු විය. නමුත් රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ 2009 ජූලි 16 දිනැති අංක MLO/MOD/22/2 දරන ලිපියෙන් ලබාදී තිබූ අනුමැතිය මත ගුවන්යානා කුලී ආදායමින් රු.13,999,792 ක් රජයේ ගිණුමක් නොවන ගුවන් හමුදාවේ අභ්‍යන්තර අරමුදලකට බැර කර තිබූ බව සමාගම විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාවකින් අනාවරණය වී තිබුණි.

(iv) 2013 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම, ආදායම් ගිණුමට අනුව රු.28,985,823 ක්වූ අතර එම හිඟ ආදායම් වාර්තාවට අනුව රු.20,622,723 ක් විය. ඒ අනුව වෙනස රු.8,363,100 ක් විය.

(v) 2001 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා කාලය තුළ සිදු කරන ලද ගුවන් ගමන්වලට අදාලව විවිධ ආයතනවලින් අය විය යුතුව තිබුණු රු.3,666,688 ක ආදායමක් වර්ෂ 07 කට අධික කාලයක් මුළුල්ලේ හිඟහිටිව පැවති අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 175(2) අනුව කටයුතු කිරීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාව අපොහොසත් වී තිබුණි.

**(උ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 22401 දරන රජයේ නිලධාරින්ට අත්කාරම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පාලන ගිණුම් සාරාංශය (ගිණුම් අංක 03) අනුව 2013 දෙසැම්බර් 31 දිනට එක් එක් ගුවන් හමුදා කදවුරෙහි අයවිය යුතු ශේෂවල එකතුව සහ ඊට අදාලව දක්වා

තිබූ සම්පූර්ණ එකතුව අතර රු.16,184,507 ක වෙනසක් විය. දියතලාව කඳවුරෙහි සේවයේ නියුතු සිවිල් නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.327,122 දේපල ණය සැසඳුම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

(ii) 1981 වර්ෂයේ සිට විෂය අංක 22401 දරන අත්තිකාරම් කාර්යය ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල දක්වා තිබුණි. නමුත් ඊට පෙර කාල වකවානුවලදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙනුවෙන් විෂය අංක0017 දරන අත්තිකාරම් කාර්යය පවත්වා තිබුණි. එම විෂය අංකය යටතේ රු.550,769 ක ණය ශේෂයක් පැවති අතර එම ශේෂය විෂය අංකය 22401 දරන අත්තිකාරම් කාර්යයට පවරා ගෙන නොතිබීම නිසා එම හිග ණය අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂයද රු.550,769 කින් අඩුවෙන් සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි.

(iii) 2013 දෙසැම්බර් 31 දිනට ගුවන් හමුදාවේ සේවා හා සිවිල් අංශයේ විශ්‍රාමික හා මියගිය, සේවය හැරගිය, වැඩ තහනම් කළ හා ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරීන්ගෙන් අයවිය යුතුව පවතින ණය පිළිබඳ කාල විශ්ලේෂණය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- සිවිල් නිලධාරීන්ගෙන් ඉකුත් වර්ෂයේ අවසානයට අයනොවී පැවති රු.17,624,415 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට රු.21,040,923 ක් දක්වා සියයට 19 කින් වැඩිවී තිබුණි.

- සේවා අංශයට අදාලව විශ්‍රාම ගිය හා මිය ගිය සේවකයින්ගෙන් සහ සේවය හැර ගිය සේවකයින්ගෙන් අයවිය යුතුව පැවති ශේෂය රු.1,995,753 ක්වූ අතර එයින් රු.489,560 ක් එනම් සියයට 25 ක් වර්ෂ 5 ට වැඩි කාලයක සිට පැවැත එන හිඟ හිටි ශේෂ විය. සිවිල් අංශයේ විශ්‍රාම ගිය, මිය ගිය, සේවය හැර ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.20,279,609 ක්වූ අතර එයින් රු.7,784,954 ක් එනම් සියයට 38 ක් වර්ෂ 05 ට වැඩි කාලයක සිට හිඟහිටව පවතින ශේෂ විය. පසුගිය වර්ෂය අවසානයට එය රු.6,298,254 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.7,784,654 දක්වා සියයට 23.6 කින් වැඩිවී තිබුණි.

## 4.4 යහපාලනය සහ ගිණුම් කටයුතු භාවය

### 4.4.1 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

ගුවන් හමුදාවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී මූල්‍ය කළමනාකරණයට අදාලව ගනු ලැබූ පහත සඳහන් තීරණයන් 2014 සැප්තැම්බර් 30 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

| රැස්වීම් දිනය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය |
|---|---|---|
| 2012 ජූනි 12 | ස්ථාවර වත්කම් ලේඛන විධිමත්ව පවත්වා ගෙන යාම<br>බැරකම් පිළිබඳ වාර්තා පවත්වා ගෙනයාම<br>පරිගණක දෘඩාංග හා මෘදුකාංග පිළිබඳ වාර්තා පවත්වා ගෙනයාම<br><br>ගුවන් හමුදාවේ ස්ථාවර වත්කම්වල වටිනාකම් විසර්ජන ගිණුමේ නිවැරදිව නිරූපනය කිරීම | 2014 අගෝස්තු 31 දින වන විටත් ගුවන් හමුදාව විසින් ඉහත තීරණ අනුව අදාල ලේඛන නිවැරදිව යාවත්කාලීන කර නොතිබුණි |
| | කඳවුරුවල භාවිතා කරන වත්කම් පිළිබඳව වාර්ෂික ස්වාධීන පරීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කිරීම | එම ස්වාධීන පරීක්ෂණ වාර්තා පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

## 4.5 වත්කම් කළමනාකරණය

ගුවන් හමුදාවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ)** 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේදී මිලදී ගත් ජංගම නොවන වත්කම්වල වටිනාකම ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවේ රු.9,770,982,543 ක් ලෙස දක්වා

තිබුණි. නමුත් විසර්ජන ගිණුමේ ඩීජීඑස්ජ්- 4 ආකෘතියෙහි එය රු.1,206,367,300 ක් ලෙස දක්වා තිබුණි. 2008 වර්ෂයේ සිට විසර්ජන ගිණුම්වල මෙවැනි වෙනස්කම් පැවති අතර ඒවා නිවැරදි කිරිමට කටයුතු කර නොතිබුණි.

(ආ) බේරුම් නොකළ බැරකම් සම්බන්ධයෙන් පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(i) විසර්ජන ගිණුම අනුව ගුවන් හමුදාවේ 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් ප්‍රමාණය රු.4,278,066,949 ක් වූ අතර, ඒ පිළිබද කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ගුවන් හමුදාව විසින් මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. මුදල් රෙගුලාසි 94 හි සඳහන් විධිවිධානයන්ට පටහැනිව වැය විෂයයන් 19 ක් සඳහා එකතුව රු.1,118,001,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී උපයෝජනය කිරීම් හා එළඹ තිබුණු බැරකම්වල එකතුව රු.1,505,596,485 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රතිපාදනය රු.387,595,485 කින් ඉක්මවා බැදීම්වලට එළඹ තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර වෙනුවෙන් රු.19,488,877 ක් ගෙවිය යුතු බවට විසර්ජන ගිණුමේ සඳහන්ව තිබු නමුත්, දුම්රිය බිල්පත් නිරවුල් කිරීමේ ලේඛනය අනුව එය රු.44,287,212 ක් ලෙස දක්වා තිබීම නිසා එම ලේඛන අතර රු.24,798,335 ක වෙනසක් නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා රේගුව වෙත නිරවුල් කළ යුතුව තිබූ රු.38,122,031 ක මුළු බදු මුදලද, 2013 වර්ෂය වෙනුවෙන් 2014 මුල් මාස දෙක තුළ වැය කර තිබූ රු.16,482,474 ක්ද, 2013 වර්ෂයේ විසර්ජන ගිණුමේ ඩී.ජී.එස්.ජ්. 8 බැරකම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.

(iii) භාණ්ඩාගාරය සමඟ 2013 සැප්තැම්බර් 27 දින පැවැති සාකච්ඡාවකින් පසු 2012 දෙසැම්බර් 31 දිනට ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු මුදල රු.1,690,467,889 ක් බව එකඟ වී තිබුණු අතර භාණ්ඩාගාර සුරකුම්පත් මගින් එම මුදල ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට පියවා තිබුණි. විසර්ජන ගිණුමේ 2012 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය වශයෙන් රු.1,690,467,889 ක් පමණක් දක්වා තිබුණි. සුරකුම්පත් නිකුත් කර ගෙවූ මුදලේ නිවැරදිතාවය සනාථ කර ගැනීමට සාක්ෂි නොතිබුණු අතර විසර්ජන ගිණුමේද එය හෙළිදරව් කර නොතිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට බැරකම් සනාථ කර ගැනීමේ සාක්ෂි නොමැතිව රු.204,548,463 ක් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු මුදලක් වශයෙන් දක්වා තිබුණි.

4.6 **අනුකූල නොවීම්**

**නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 177 (4) | ගණනය කළ නොහැක. | ගුවන් හමුදාව විසින් වාහන වෙන්දේසි කිරීම ඇතුළුව වත්කම් අපහරණය කිරීමෙන් රැස්කරන ලද ආදායම් පිළිබඳ තොරතුරු ඇතුළත් මාසික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ)2004 ඔක්තෝබර් 18 දිනැති අංක 174 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 ඡේදය | - එම - | 2004 ජනවාරි 01 දිනෙන් පසුව මිලට ගෙන තිබූ ජංගම නොවන වත්කම් සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් අර්ධ වාර්ෂික වාර්තා සකස් කර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**4.7 කාර්යසාධනය**

රජය මගින් ඉදිකිරීම් හා සංචාරක ක්ෂේත්‍රයට අදාලව සිදු කරන කඩිනම් සංවර්ධන කටයුතු වෙනුවෙන් ගුවන් හමුදාව විසින් හදිසි හා අත්‍යාවශ්‍ය මිලදී ගැනීම් සිදු කර තිබුණි. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවන් අනුව නොලැබෙන අවස්ථාවලදී ගුවන් හමුදාව විසින් පවත්වාගෙන යන විධායක සුභසාධන අරමුදලින් හා සේවා ආයතන අරමුදල්වලින් අවශ්‍ය මුදල් සපයාගෙන තිබුණි. එසේ ලබා ගත් රු.169,463,018 ක අරමුදල් ගුවන් හමුදාව විසින් 2013 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ අදාළ අරමුදල් වෙත ප්‍රතිපූර්ණය කර තිබුණි.

**4.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

බැංකු ගිණුමක 2011, 2012 හා 2013 යන වර්ෂ 03 ට අදාලව පැවත එන රු.216,257 ක්වූ හඳුනා නොගත් ලැබීම් හා 2011 වර්ෂයේ සිට පැවත එන රු.5,000 ක හඳුනා නොගත් ගෙවීම් 2013 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

**4.9 අවිධිමත් ගනුදෙනු**

ගුවන් හමුදාව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම - ගුවන්පුර වැඩබිම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(i) අභ්‍යන්තර මාර්ග ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ ලංසු ඉදිරිපත් කිරීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව දින 14 ක කාලයක් ලබාදිය යුතු වුවත්, ඒ සඳහා දින 05 ක් පමණක් ලබා දී තිබුණි. එක් ලංසුකරුවෙකු පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණු අතර 7.12.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසුව ප්‍රතික්ෂේප කළ යුතුව තිබුණද, ලංසුකරුගේ මිල ගණන් පිළිගෙන රු.4,018,200 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. දෙපාර්තමේන්තු ඇස්තමේන්තු විගණනයට ඉදිරිපත් නොවීම මත මෙම මිල ගණන්වල සාධාරණත්වය විගණනයට සනාථකර ගත නොහැකි විය.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.4 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසුකරු සමග අවබෝධතා ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 මාර්ගෝපදේශය හා සබැඳි මාර්ගෝපදේශ කාර්ය සංග්‍රහය ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් ගිවිසුම උල්ලංඝණය කළහොත් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදලින් සියයට 5 කට නොඅඩු කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි.

(iv) සවලීකරණ අත්තිකාරම් සඳහා ඇප බැඳුම්කරයන් මත උක්ත කොන්ත්‍රාත්තුවට අදාලව ගෙවිය හැකි උපරිම අත්තිකාරම් මුදල රු.803,640 ක් වුවත් එවැනි සුරක්ෂණයක්ද නොමැතිව සැපයුම්කරු වෙත අත්තිකාරම් වශයෙන් රු.3,375,288 ක් ගෙවා තිබුණි. එම අත්තිකාරම් මුදල එකතු කළ අගය මත බදු මුදලද සැලකිල්ලට ගත් විට කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් සියයට 75 කට සමාන වී තිබුණි.

(v) භාණ්ඩාගාරයෙන් අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම නිසා ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීම සඳහා පළමුව විධායක සුභසාධක අරමුදල්වලින් ගෙවීම් කර තිබූ අතර පසුව රජයේ අරමුදල්වලින් එම මුදල් සුභසාධන අරමුදල වෙත ප්‍රේෂණය කර තිබුණි.

(ආ) **වාහන පාලනය හා අපහරණය**

--------------------------------

වාහන පාලනය හා අපහරණය සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) ගුවන් හමුදාව සතු වාහන 192 ක එන්ජින් අංක හා චැසි අංක විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ගුවන් හමුදාවට හිමිකමක් නොමැති වාහන 2 ක් 2013 වර්ෂයේදී ගුවන් හමුදාව විසින් වෙන්දේසියේ විකුණා තිබූ බව නිරීක්ෂණය විය.

## 4.10 විසඳා නොතිබුණු විගණන ඡේද

-----------------------------------

විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු පහත සඳහන් විගණන ඡේද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින්ද පරීක්ෂාකර නියෝග නිකුත් කර තිබුණත් 2013 දෙසැම්බර් 31 දින වන විටත් එම නියෝගයන් අනුව කටයුතු කර නොතිබුණි.

| | **රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පැවති දිනය** | **නියෝග අංකය** | **විගණන ඡේදය** |
|---|---|---|---|
| (i) | 2011 ජුනි 23 | 10 | රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුමේ පවතින පැරණි ශේෂ නිරවුල් කිරීම |

| | | | |
|---|---|---|---|
| (ii) | 2011 ජූනි 23 | 18 II | ක්‍රීඩා පිට්ටනිය කුලියට දී ලබන ආදායම් හා අනෙකුත් රැස්කිරීම් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම |
| (iii) | 2011 ජූනි 23 | 16 | විසර්ජන ගිණුමේ දැක්වෙන වටිනාකම් තහවුරු කරගත හැකි වන පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම |

## 5. ශීර්ෂය 225 - පොලිස් දෙපාර්තමේන්තුව

### 5.1 විගණන විෂය පථය

පොලිස් දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජුනි 16 දින පොලිස්පතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 5.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම.

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 5.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පොලිස් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 5.4 සිට 5.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

වැය විෂයයන් 07 ක් සඳහා එකතුව රු.729,608,000 ක අධිප්‍රතිපාදන සළසා තිබීම නිසා රු.556,789,621 ක ප්‍රතිපාදන උපයෝජනයෙන් පසු ඉතිරියන්ගේ එකතුව රු.172,818,621 ක් වී තිබුණි. එම ඉතිරියන් සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 සිට සියයට 52 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### (ආ) පොදු තැන්පත් ගිණුම

2013 දෙසැම්බර් 31 දිනට අංක 6000/0/0/0015/0016 දරන පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.237,991,086 ක් විය. වර්ෂ 02 ඉක්ම වූ රු.19,292,111 ක් වූ තැන්පතු 160 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### (ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 22501 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණු මියගිය හා විශ්‍රාමගිය නිලධාරින්ගෙන් අයවිය යුතු එකතුව රු.33,152,939 ක ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.2.3, 4.2.4 සහ 4.2.5 වගන්ති ප්‍රකාරව එම ණය ශේෂ අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ii) වැඩතහනම් කළ හා සේවය හැර ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂවල වටිනාකම රු.89,605,810 ක් වි තිබුණු අතර එම ණය ශේෂ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව කටයුතු කර අයකර ගෙන නොතිබුණි.

(iii) වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වීම් ලබා ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු එකතුව රු.3,065,964 ක් 2009 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර අයකර ගැනිමට 2013 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**5.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**5.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**5.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**5.4.3 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

සමාලෝචිත වර්ෂයේදී පොලිස් දෙපාර්තමේන්තුවේ විගණන හා කළමනාකරණ කමිටුව රැස්වී නොතිබුණි.

**5.5 වත්කම් කළමනාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා වලින් පෙන්වා දී තිබුණු අතිරික්තතා හා ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757 (2) හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය

මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 මාර්තු 31 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් පොලිස් දෙපාර්තමේන්තුව විසින් එසේ කටයුතු කර නොතිබුණි.

## 5.6 ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම

පොලිස් දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ඉදිකිරීම් ව්‍යාපෘති ආරම්භකර තිබුණත් එම ව්‍යාපෘති නිම නොකර අතහැර තිබුණි.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු පිරිවැය | ආරම්භ කළ දිනය | නිම කළ යුතු දිනය | 2013.12.31 දින වන විට වියදම | අතහැර දැමීමට හේතු |
|---|---|---|---|---|---|---|
| | | රු. | | | රු. | |
| (i) | ඉගිනියාගල පොලිස් ස්ථානයේ තනිකඩ හට නිවාස ඉදිකිරිම | 999,940 | 1998.10.20 | 1999.01.31 | 863,948 | කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතු නිසි ආකාරයෙන් සිදුනොකිරීම |
| (ii) | දමන පොලිස් ස්ථානයේ තනිකඩ හට නිවාස ඉදිකිරිම | 997,052 | 1998.10.20 | 1999.01.31 | 861,452 | කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතු නිසි ආකාරයෙන් සිදුනොකිරීම. |
| (iii) | ඇල්ල පොලිස් ස්ථානයේ ගොඩනැගිල්ල ඉදිකිරිම. | 16,382,487 | 2007.04.26 | 2008.02.27 | 5,331,930 | කොන්ත්‍රාත් සමාගම වසාදැමීම හේතුවෙන් ඉදිකිරිම් නිසියාකාරව සිදුනොකිරිම. |
| (iv) | වලස්මුල්ල පොලිස් ස්ථානයේ ගොඩනැගිල්ල ඉදිකිරිම. | 20,985,104 | 2007.09.17 | 2008.06.28 | 10,832,376 | කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු නිසි ප්‍රමිතියකට අනුව සිදු නොකිරිම |
| (v) | සීදුව පොලිස් ස්ථානයේ ගොඩනැගිල්ල ඉදිකිරිම | 9,928,123 | 2007.08.27 | 2008.01.10 | 6,783,588 | කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු නවතා දැමීම. |

ඉදිකිරීම් සම්බන්ධ ප්‍රගති වාර්තා සකස් නොකිරීම සහ ඒ සම්බන්ධ පසු විපරම් ක්‍රියාවලියක් සිදුනොවීම මත මෙම ඉදිකිරීම් සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය කර ගත නොහැකි විය.

## 5.7 කාර්යසාධනය

ශ්‍රී ලංකාව තුළ 2012 සහ 2013 වර්ෂවලට අදාලව වාර්තා වූ ග්‍රහන අපරාධ (ශාරීරික වැරදි දේපළ වැරදි) පිළිබඳ සමාලෝචනයන් පහත දැක්වේ.

| | ග්‍රහන අපරාධ | 2013 | | | 2012 | | |
|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ ගණන | විසඳූ ගණන | විසඳූ ගණනේ ප්‍රතිශතය | වාර්තා වූ ගණන | විසඳූ ගණන | විසඳූ ගණනේ ප්‍රතිශතය |
| | **ශාරීරික වැරදි** | | | | | | |
| 01 | අපහරණය / පැහැරගෙන යාම් | 1075 | 887 | 82.51 | 1240 | 1061 | 85.5 |
| 02 | බරපතල තුවාල සිදුකිරීම් | 1414 | 1330 | 94.05 | 1727 | 1636 | 94.7 |
| 03 | පිහි ආදියෙන් තුවාල සිදුකිරීම් | 2683 | 2466 | 91.91 | 2870 | 2750 | 95.8 |
| 04 | මනුෂ්‍ය ඝාතනය / සියපණ හානිකර ගැනීමට අනුබල දීම | 586 | 522 | 89.08 | 646 | 577 | 89.3 |
| 05 | මනුෂ්‍ය ඝාතනයට තැත්කිරිම | 209 | 191 | 91.38 | 227 | 204 | 89.8 |
| 06 | ස්ත්‍රී දූෂණය / බාල ගැහැණු ළමුන් සමග කාමුක සංසර්ගය | 2193 | 2051 | 93.52 | 2212 | 2139 | 96.6 |
| 07 | අස්වාභාවික වැරදි / පුරුෂයන් අතර තදබල අශෝබන ක්‍රියා | 614 | 555 | 90.39 | 576 | 555 | 96.3 |
| 08 | ළමුන්ට කෲර ලෙස සැලකීම හා ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම | 395 | 370 | 93.67 | 398 | 384 | 96.4 |
| 09 | කාමුක සංසර්ගය සඳහා ස්ත්‍රියක / ගැහැණු ළමයකු සැපයීම හා වෙළදාම | 09 | 08 | 88.88 | 31 | 30 | 96.7 |
| | **එකතුව** | **9178** | **8380** | **91.30** | **9927** | **9336** | **94.04** |
| | **දේපළ වැරදි** | | | | | | |
| 01 | ගිනිතැබීම | 444 | 286 | 64.41 | 585 | 368 | 62.9 |
| 02 | රු.5,000 ට වැඩි අලාභ ඇතිවන පරිදි සිදුකරන අනර්ථ | 1025 | 809 | 78.92 | 1096 | 856 | 78.1 |
| 03 | ගෙවල් බිදීම හා සොරකම | 16123 | 6116 | 37.93 | 16763 | 6346 | 37.85 |
| 04 | කැරලි කෝලහල | 07 | 06 | 85.71 | 18 | 15 | 83.33 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 05 | මංකොල්ලකෑම | 4748 | 2573 | 54.19 | 6552 | 3472 | 52.99 |
| 06 | බලෙන් පැහැර ගැනීම | 140 | 111 | 79.28 | 138 | 113 | 81.88 |
| 07 | රැවටීම්/වංචා සහගත ලෙස අත්සන් ගැනීම් රු.100,000ට වැඩි වටිනාකම සම්බන්ධයෙන් සාපරාධි විශ්වාසය කඩකිරිම | 10421 | 6010 | 57.67 | 8820 | 5630 | 63.83 |
| 08 | වැව්ලි ද්‍රව්‍ය ඇතුළු රු.5,000 ට වැඩි දේපළ සොරකම හා කුමන වටිනාකමක් හෝ වන පරිදි පා පැදි හා ගව සොරකම | 11436 | 6748 | 59.00 | 11704 | 6483 | 55.39 |
| 09 | ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණය කිරීම | 59 | 50 | 84.74 | 45 | 45 | 100.0 |
| 10 | රාජ්‍ය විරෝධි අන්දමින් සිදුකෙරෙන වැරදි | 01 | 01 | 100.0 | 05 | 02 | 40.0 |
| 11 | දරුණු ආයුධ පනත යටතට ගැනෙන වැරදි | 125 | 111 | 88.80 | 162 | 138 | 85.1 |
| 12 | ස්වයංක්‍රීය හෝ රිපිටර් පතරොම් තුවක්කු ලඟතබා ගැනීම | 33 | 32 | 96.96 | 32 | 28 | 87.5 |
| 13 | හෙරොයින්, කොකේන්, මෝෆින් කිසියම් ප්‍රමාණයක් නිෂ්පාදනය කිරිම, වෙළඳාම් කිරිම, ආනයනය කිරිම හෝ අපනයනය කිරිම හෝ හෙරොයින් ග්‍රෑම් 02 ක් හෝ ඊට වැඩි ඔපියම් ග්‍රෑම් 500 ක් හෝ ඊට වැඩි ගංජා කි.ග්‍රෑම් 05 ක් හෝ ඊට වැඩි හා හෂීස් කි.ග්‍රෑම් 01 ක ප්‍රමාණයක් වු අන්තරාදායක මත්ද්‍රව්‍ය ළඟ තබාගැනීම. | 1604 | 1594 | 99.37 | 1315 | 1300 | 98.85 |
| | **එකතුව** | 46166 | 24447 | 52.95 | 47235 | 24796 | 52.49 |
| | **මුළු එකතුව** | **55344** | **32827** | **59.31** | **57162** | **34132** | **59.71** |

ඒ ඒ වර්ෂවල විසඳී නොමැති පැමිණිලි සම්බන්ධ තොරතුරු ඉදිරියට ගෙන ඒමේ ක්‍රමවේදයක් නොමැති බැවින් 2013 දෙසැම්බර් 31 දිනට සත්‍ය වශයෙන් විසඳී නොමැති පැමිණිලි සංඛ්‍යාව ලබාගත නොහැකි විය. නොවිසඳී ඇති අපරාධ සම්බන්ධව හා අපරාධ විසඳීමේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමට පසු විමර්ශන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

**5.8 බැංකු ගිණුම්**

**--------------**

**ගැලපුම් කළයුතු ශේෂ**

**----------------------**

දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් මාසය වෙනුවෙන් පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව තැන්පත් කර තිබුණු නමුත් උපලබ්ධි නොවූ රු.28,000 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 189 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**5.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**------------------------------**

**අශ්වයින් 21 දෙනෙකු විදේශ සමාගමකින් මිල දී ගැනීම**

**----------------------------------------------------------------**

සමාලෝචිත වර්ෂයේදී පොලිස් දෙපාර්තමේන්තුව රු.57,188,819 ක් වැයකර දේශිය නියෝජිත ආයතනයක් සම්බන්ධ වී නෙදර්ලන්ත විදේශ සමාගමකින් අශ්වයින් 21 දෙනෙකු මිලදී ගෙන තිබුණි. මෙම අශ්වයින් අතරින් රු.8,169,831 ක් වටිනා අසුන් තිදෙනෙකු මාස 03 ක, මාස 06 ක හා මාස 12 ක වැනි ඉතා කෙටි කාලයක් තුළ මියයාම හේතුවෙන් මිලදී ගැනීමේදී අශ්වයින්ගේ සෞඛ්‍ය තත්ත්වය කෙරෙහි සැලකිලිමත් වී තිබුණේද යන්න පිළිබඳව මතභේදයට තුඩු දී තිබුණි.

**5.10 පාඩු හා හානි**

**-------------**

විසර්ජන ගිණුමේ දක්වා තිබුණු එකතුව රු.289,227,523 ක් වූ අලාභහානි 948 ක් මුදල් රෙගුලාසි 109 විධිවිධිධාන ප්‍රකාරව කටයුතු කර අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**5.11 මානව සම්පත් කළමනාකරණය**

**--------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව සහ තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-------------------------------------------------------**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 736 | 443 | 293 |
| (ii) | තෘතීයික මට්ටම | 3,209 | 3,150 | 59 |
| (iii) | ද්විතීයික මට්ටම | 82,685 | 70,202 | 12,483 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 2,992 | 2,955 | 37 |
| | **එකතුව** | **89,622** | **76,750** | **12,872** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 12,872 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

## 6. ශීර්ෂය 226 - ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

### 6.1 විගණන විෂය පථය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගතවූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජුලි 14 දින පාලක ජනරාල් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 6.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන

පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**6.3 විගණන නිරීක්ෂණය**

**-----------------------**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ආ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 6.4 සිට 6.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

**-------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් හතරක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 28 ත් සියයට 81 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපාදන සළසා නොතිබුණු වැය විෂයයන් යටතේ රු.1,858,676 ක් වූ බැරකම්වලට එළඹ තිබුණි.

(iii) 2013 වර්ෂයේ ගෙවිය යුතුව තිබුණු රු.6,309,022 ක් වූ බැරකම් 2014 වර්ෂයේ දී ගෙවා තිබුණත්, එම බැරකම් 2013 වර්ෂයේ විසර්ජන ගිණුමේ දක්වා නොතිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**--------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව විසින් ණය ගෙවීමේදී පිළිපැදිය යුතු විධිවිධාන අනුගමනය නොකර රු.6,204,517 ක ණය ගෙවා තිබුණි.

(ii) දෙපාර්තමේන්තුව විසින් කේවල ගිණුම් ශේෂ ලේඛනයේ එකතුව පාලන ගිණුමේ ශේෂය සමග සසඳා නොතිබුණි. පාලන ගිණුමේ ශේෂය රු. 126,540,485 ක් වූ අතර කේවල ශේෂ ලේඛනයේ එකතුව රු. 126,459,768 ක් වී තිබුණි.

**6.4** අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

වැය විෂයයන් තුනකට සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය රු.258,529 ක් වුවත්, මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව එම ඉතිරිය රු.7,841,021 කින් ඉක්මවා රු.8,099,550 ක බැරකම්වලට එළඹ තිබුණි.

**6.5** කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණයේදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියේ තොරතුරු අනුව 2005 ජනවාරි 01 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා ලංකාවට පැමිණි විදේශිකයින්ගෙන් 15,282 දෙනෙක් වීසා රහිතව රට තුළ රැඳී සිටින බව පෙන්වා තිබුණි. ඒ අය අතර 2013 ජනවාරි 01 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා ශ්‍රී ලංකාවට පැමිණි විදේශිකයින් 7,119 දෙනෙක්ද විය. දෙපාර්තමේන්තුවේ විමර්ශණ හා විශේෂ විමර්ශණ සහ බුද්ධි නියාමක යන අංශ මඟින් පුද්ගලයින් 955 දෙනෙකු ගැන පමණක් සමාලෝචිත වර්ෂයේදී විමර්ශණය කර තිබුණු අතර ඉන් 721 දෙනෙකු රටින් පිටුවහල් කිරීමට කටයුතු කර තිබුණි.

(ආ) කල් තබා වීසා ලබා නොගෙන රටට ඇතුළුවන විදේශිකයින් හට වීසා ලබාදීමේ ක්‍රියාවලියේදී දෙපාර්තමේන්තු නිලධාරීන් අයුතු ලෙස විදේශිකයින්ගෙන් මුදල් ලබා ගන්නා බව රජයේ විගණන අංශය වෙත ලැබී තිබුණු නියෝජනයන්ගෙන් පැහැදිලි විය. ඒ පිළිබඳ වැඩිදුරටත් සිදුකළ පරීක්ෂණවලදී ගුවන් තොටුපලේදී වීසා නිදහස් කිරීම් සම්බන්ධව දෙපාර්තමේන්තු නිලධාරීන් අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටි පිළිබඳ උපදෙස් ඇතුළත් කිසිදු චක්‍රලේඛයක් 2014 ජුලි 23 දින වන විටත් නිකුත්කර නොතිබුණු බවත් ඒ අනුව දෙපාර්තමේන්තු නිලධාරීන්ට අයථා මුදල් පරිහරණය සඳහා ඉඩ සැලසී තිබෙන බවත් නිරීක්ෂණය විය.

(ඇ) සංචරණය සඳහා විද්‍යුත් අනුමැතිය ක්‍රියාත්මක කිරීමේ පද්ධතිය පිහිටුවීම සම්බන්ධ ගිවිසුමේ විධිවිධානවලට අනුව අදාල වෙබ් පිටුවේ නිර්මාණකරුට එම වෙබ් පිටුව තුළ පෞද්ගලික ප්‍රචාරණය සඳහා අවසර දී නොතිබුණි. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පෞද්ගලික දුරකථන සමාගමක් සිය නිල ලාංඡනය එම වෙබ් පිටුව තුළ ප්‍රදර්ශනය කර තිබුණි. මේ පිළිබඳව රජයේ විගණන අංශයෙන් සිදුකළ කරුණු පෙන්වා දීමට ප්‍රතිචාරයක් වශයෙන්, ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයා අමතන ලද ශ්‍රී

ලංකා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ 2013 දෙසැම්බර් 09 දිනැති ලිපිය අනුව අදාල ප්‍රචාරණයන් සිදුකිරීමට අවස්ථාවක් ලබාදීම සඳහා ටෙන්ඩර් කැඳවිය යුතු බව සඳහන් විය. ඒ අනුව අදාල කෙටුම්පත් ටෙන්ඩර් ලියවිලි සකසා ඉදිරිපත් කරන ලෙස 2014 මාර්තු 25 දින රාජ්‍ය ආරක්ෂක ලේකම්වරයා විසින් දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් වෙත දන්වා තිබුණි. කෙසේ වෙතත් අදාල පුද්ගලික දූරකථන සමාගම සිය නාමය හා නිල ලාංඡනය 2014 අගෝස්තු 31 දින වන විටත් දෙපාර්තමේන්තු වෙබ් පිටුවේ ප්‍රචාරණය කරමින් පැවතුණි.

(ඈ) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පෞද්ගලික දූරකථන සමාගමක් සිය දූරකථන සිම්පත් ආගමන කවුළුවලදී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මගින් විදේශිකයින්ට ලබාදීමේ වැඩ පිළිවෙලක් දෙපාර්තමේන්තුවේ සුභසාධක සංගමය හරහා ක්‍රියාත්මක කර තිබුණි. විදේශිකයින්ගේ ගමන් බලපත් අංකය සමාගමේ දූරකථන ජාලයට ඇතුළත් කිරීම මගින් මෙම සිම්පත් බලගන්වා තිබුණි. මෙම කාර්යය දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් තම රාජකාරි කාලය පෞද්ගලික සමාගමක ප්‍රවර්ධන කටයුතු සඳහා යොදා ගෙන තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද, ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයින්ගේ තොරතුරු ආගමන නිලධාරීන් හරහා ඔවුන්ගේ සුභසාධක සංගමය මගින් පෞද්ගලික සමාගමක් වෙත ලබාදී තිබුණු බවද විගණනයේදී නිරීක්ෂණය විය.

(ඉ) ද්විත්ව පුරවැසි සහතික නිකුත් කිරීම තාවකාලිකව නවතා තිබියදී දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණු අයදුම්පත් 162 ක් සඳහා 2013 වර්ෂයේදී ද්විත්ව පුරවැසි සහතික නිකුත් කර තිබුණු බවත් ඉන් රු. 22,950,000 ක ආදායමක් දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණු බවත් පරිගණක දත්ත පද්ධතියට අනුව නිරීක්ෂණය විය.

(ඊ) ගුවන් තොටුපල හරහා රටින් බැහැරවන ඇතැම් මගීන්ගේ ගමන් බලපත්වල ශ්‍රී ලංකාවෙන් පිටවූ බවට පිටවීමේ සටහන් යොදා නොතිබුණු අවස්ථා තිබුණු බවට හා ඒ පිළිබඳව පර්යන්ත පාලන පද්ධතියේ සටහන් වී නොතිබුණු බවට සාක්ෂි, ශ්‍රී ලංකාවට ආපසු හරවා එවා තිබුණු ඇතැම් මගීන්ගේ ගමන් බලපත් පිළිබඳව සිදු කළ සෝදිසි පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

(උ) ගුවන් තොටුපොලේදී මත්ද්‍රව්‍ය හෝ නීති විරෝධී භාණ්ඩ ප්‍රවාහනය වැනි කරුණු සම්බන්ධයෙන් රඳවාගනු ලබන විශේෂ අවධානයක් යොමු කළ යුතු මගීන් වෙනුවෙන් කටුනායක ගුවන් තොටුපලේ ආගමන හා විගමන පරිශ්‍රයේ ඒ සඳහා සුදුසු විශේෂ

ස්ථානයක් සකස් කර නොතිබුණි. ඒ හේතුවෙන් අදාල ආගමන හා විගමන නීති ක්‍රියාත්මක කිරීමට අපහසුවූ අවස්ථා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඌ) දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට එරෙහිව අවිනය පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් ආරම්භ කර තිබුණු විනය පරීක්ෂණ කඩිනමින් සිදු කර නොතිබුණි. මේ නිසා දෙපාර්තමේන්තු නිලධාරීන් විදේශිකයින් සමඟ අයථා ගනුදෙනු සිදුකිරීම පිළිබඳව ලැබෙන පැමිණිලි කඩිනමින් විභාග කර නීතිමය කටයුතු කිරීම ප්‍රමාද කිරීම නිසා එවැනි අයථා කටයුතු තවදුරටත් සිදු කිරීමට අවස්ථා සැලැසීමක් වශයෙන් විගණනයේදී නිරීක්ෂණය විය.

**6.6 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 60 | 47 | 13 |
| (ii) | තෘතීයික මට්ටම | 02 | 02 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 821 | 742 | 79 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 133 | 119 | 14 |
| (v) | වෙනත් | - | 02 | - |
| | **එකතුව** | **1,016** | **912** | **106** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 106 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

## 7. ශීර්ෂය 227 - පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

### 7.1 විගණන විෂය පථය

පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගතවූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජුලි 14 දින කොමසාරිස් ජනරාල් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 7.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත්වේ.

### 7.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ආ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 7.4 සිට 7.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) අයවැය විචලනය

වැය විෂයයන් හතරක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 52 ත් සියයට 91 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 22701 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.704,429 ක් වී තිබුණි. එම හිඟහිටි ශේෂයෙන් රු. 43,958 ක් 2014 දෙසැම්බර් මාසය වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 7.4 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

වැය විෂයයන් පහක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය රු.268,623 ක් වී තිබුණු. මුදල් රෙගුලාසි 94(i) ට පටහැනිව එම ඉතිරිය රු.1,860,726 කින් ඉක්මවා රු.2,129,349 ක බැරකම්වලට එළඹ තිබුණි.

## 7.5 කළමනාකරණ දුර්වලතා

දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා ශ්‍රී ලාංකා රජයේ ප්‍රතිපාදන මත විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2007 වර්ෂයේ ආරම්භ කර තිබුණු නමුත් 2009 සැප්තැම්බර් 09 දින පැවති අමාත්‍ය මණ්ඩලයේ තීරණයක් මත අදාල ප්‍රසම්පාදනය අවලංගු කිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු නතර වී තිබුණි. කෙසේ වෙතත් 2011 අගෝස්තු 17 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයක් අනුව ව්‍යාපෘතියේ කටයුතු 2012 වර්ෂයේදී නැවත ආරම්භ කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේදී ව්‍යාපෘතියේ කටයුතු නතර වී තිබූ අවස්ථාවේදි ව්‍යාපෘතිය වෙනුවෙන් එකතුව රු.314,199,087 ක් වැය කර තිබුණි. තවද, 2012 වර්ෂයේදි හා 2013 වර්ෂයේදී ව්‍යාපෘතියේ කටයුතු සඳහා රු.153,634,785 ක් වැය කර තිබුණි.

(ආ) 2014 මැයි 26 දිනැති අංක පුලිදෙ/මුදල්/09/විවිධ/02/2014 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයාගේ ලිපිය පරිදි 2016 වර්ෂයේදී විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ කටයුතු ආරම්භ කළ යුතුය. කෙසේ වෙතත් ව්‍යාපෘතියේ කටයුතු සඳහා සැපයුම්කරුවකු 2013 වර්ෂය අවසානයේදී තෝරාගෙන තිබීමත්, 2014 වර්ෂයේ මුල් භාගයේදී සිදු කළ යුතු බවට සැලැසුම් කර තිබුණු පුද්ගල තොරතුරු හා

ජීවමිතික තොරතුරු රැස්කිරීමේ කටයුතු 2014 ජුනි 30 දින වන විටත් ඉටුකර නොතිබීමත් හේතුවෙන් අපේක්ෂිත පරිදි විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම දුෂ්කර වී තිබුණි. මේ සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් ව්‍යාපෘතියේ කාර්යය සැලැස්ම වෙනස්කර තිබෙන බවත්, පුද්ගල දත්ත හා ජීවමිතික තොරතුරු රැස්කිරීමේ කටයුතු නියමු ව්‍යාපෘතියක් ලෙස දකුණු පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක 2014 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කර තිබුණු බවත්, ඉන්පසුව මාස හයක කාල සීමාවක් ඇතුළත දිවයින පුරා මෙම තොරතුරු රැස්කිරීම සිදුකර අවසන් කරන බවත් විගණනය වෙත දන්වා තිබුණි. .

(ඇ) දෙපාර්තමේන්තුවේ 2013 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව පහත සඳහන් අවස්ථාවල විද්‍යුත් හැඳුනුම්පත් ව්‍යාපෘති කාර්යභාරය ඉටුකිරීමේ ප්‍රගතිය ප්‍රමාණවත් ලෙස ලඟා කරගෙන නොතිබුණි.

(i) ව්‍යාපෘතියේ ප්‍රධාන දත්ත ගබඩාව පිහිටුවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රුපියල් මිලියන 3.5 ක ප්‍රතිපාදන සළසා ගෙන තිබුණද, ඉන් කිසිදු උපයෝජනයක් සිදුකර නොතිබුණු අතර ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුළ ප්‍රධාන දත්ත ගබඩාව පිහිටුවීමට සැලැසුම් කිරීම පමණක් සිදුකර තිබුණි.

(ii) ආපදා ප්‍රති සැකසුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සඳහා රුපියල් මිලියන 20 ක ප්‍රතිපාදන සළසා තිබුණද ඉන් රුපියල් මිලියන 0.0114 ක් වැය කර සූරියවැව තාක්ෂණික උද්‍යානයේ ඉඩමක් අත්පත් කරගෙන තිබුණි. එහි සැලැසුම් හා ඉදිකිරීම් කටයුතු ඉදිකිරීම් ඉංජිනේරුමය කටයුතු පිළිබඳ මධ්‍යම කාර්යාංශය (CECB) වෙත ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර තිබුණි.

(iii) මිනිස් ශ්‍රමය යොදා දත්ත රැස්කිරීම, ඒ සඳහා අවශ්‍ය සංනිවේදන ද්‍රව්‍ය හා උපකරණ සැපයීමට රුපියල් මිලියන 171.7 ක ප්‍රතිපාදන සළසා තිබුණි. ඉන් රුපියල් මිලියන 1.74 ක් උපයෝජනය කර ඇඟිළි සළකුණු ලබා ගැනීමට අදාළ උපකරණ මිලදී ගැනීම සඳහා පමණක් ලංසු නිකුත් කර තිබුණි.

(iv) ව්‍යාපෘතිය වෙනුවෙන් 2012 වර්ෂයේදී එකතුව රු.748,852 ක් වැය කර ප්‍රොජෙක්ටර් 4 ක් මිලදී ගෙන තිබුණද, ඉන් දෙකක් අස්ථානගත වී තිබුණි. ඒ පිළිබඳ විමර්ශන කටයුතු සිදු කරමින් පැවැතුණි.

(v) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගොපදේශය ප්‍රකාරව ලංසු ඉදිරිපත් කිරීම සඳහා තරඟකරුවන්ට අවම වශයෙන් දින 21 ක් ලබා දිය යුතු වුවත්, විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමට අදාල අයදුම්පත් මුද්‍රණය කිරීමට සැපයුම්කරුවකු තෝරා ගැනීම සඳහා දින 15 ක කාලයක් පමණක් ලබාදී

තිබුණි. මේ නිසා ලංසු කරුවන් 04 දෙනෙක් පමණක් ඒ සඳහා ලංසු ඉදිරිපත් කර තිබුණි. නියමිත කාලය ලබා නොදීම හේතුවෙන් තරගකාරී ලංසු කරුවන්ට ඉදිරිපත් වීමට තිබු ඉඩකඩ ඇහිරීයාම හේතුවෙන් රජයට ලැබීය හැකිව තිබුණු ආර්ථික වාසියක් අහිමිවී තිබුණි. මුද්‍රණ ආයතන 13 කින් ලංසු ලියවිලි ලබාගෙන තිබුණු බවත් ඒ සම්බන්ධයෙන් ලංසු කරුවන් 04 දෙනෙක් පමණක් ඉදිරිපත් වී තිබුණි. එමෙන්ම මේ සඳහා අවශ්‍යවන මුද්‍රණ යන්ත්‍ර ප්‍රාග්ධනය හා අවශ්‍ය ධාරිතාවය බොහෝ ආයතනවලට නොමැති වීම මත ලංසු 04 ක් පමණක් ඉදිරිපත් වී තිබුණි.

(vi) ව්‍යාපෘතියේ කටයුතු වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීමට මිල ලංසු කැඳවීමෙන් පසු 2013 ඔක්තෝබර් 15 දින තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ පරිදි අදාල මිල ගණන් එවූ ආයතනවලින් නියැදි පරීක්ෂා කිරීම් සිදුකර තිබුණි. ඒ අනුව ඒවායේ යෝග්‍යතාවය පිළිබඳව සෑහීමකට පත්වූ බව ලිපිගොනුවල සටහන් කර තිබුණි. නමුත්, අදාල ගෘහ භාණ්ඩ නියැදි පරීක්ෂා කිරීම සඳහා උපකරණ 2013 නොවැම්බර් 28 දිනට ප්‍රථම ප්‍රධාන කාර්යාලය වෙත රැගෙන එන ලෙස ලංසුකරුවන් වෙත ලිපි යවා තිබුණේ උක්ත තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ සිදුකළ 2013 ඔක්තෝබර් 15 දිනට පසු දිනවලදීය. 2013 නොවැම්බර් 28 දිනට ප්‍රථම අදාල නියැදි පරීක්ෂා කිරීම් සඳහා එවන ලෙස ලිපි යවා තිබියදී, 2013 ඔක්තෝබර් 15 දින එම නියැදිවලට අදාල නිර්දේශ ඉදිරිපත් කර ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්ගේ පැහැදිලි කිරීම අනුව රු.4,489,353 ක ඉතිරියක් ඇති කර ගත හැකිව තිබුණද තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශවලින් හා පෙර පරීක්ෂාවලින් නුසුදුසු යැයි තීරණය කළ භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

(vii) ව්‍යාපෘතිය යටතේ නිලධාරීන් පුහුණු කිරීමට ඇඟිලි සලකුණු මුද්‍රා ලබාගන්නා උපකරණ 100 ක් මිලදී ගෙන තිබුණු අතර, මිල ගණන් කැඳවීමේදී එම උපකරණයක සෙ.මි. 10X20 ප්‍රමාණයකින් යුක්ත විය යුතු බව සඳහන් කර තිබුණි. කෙසේවෙතත් රාජ්‍ය ආයතනයකින් මිලදී ගෙන තිබුණු උපකරණවල ප්‍රමාණය සෙ.මි.12 X 6 ක් වූ අතර ඒ අනුව ඒවා පිරිවිතරයට අනුකූල වී නොතිබුණි.

(viii) .තවද සෙ.මි. 15-17 X සෙ.මි. 7-9 X සෙ.මි.1/2 ප්‍රමාණයේ ඇඟිලි සලකුණු පෑඩ් සහ Ridge builder/ Enhancer වර්ගයේ තීන්ත ලබා ගත යුතු බව තාක්ෂණ ඇගයීම් කමිටුව දන්වා තිබුණු අතර ඒ අනුව අදාල භාණ්ඩ පුද්ගලික සමාගමක් මගින් සෘජුවම ආනයනය කර තිබුණි. කෙසේ වෙතත් අදාල තීන්ත පෑඩ් එකක

දිග 10 X 6 ප්‍රමාණයෙන් වීම, තීන්ත Ridge builder වර්ගයේ නොවීම, තීන්ත පෑඩ් ආනයනය කළද දෙපාර්තමේන්තුවට ගෙන ඒමෙන් පසුව දෙපාර්තමේන්තු පරිශ්‍රය තුළදී ආනයනික සමාගමේ නම, සන්නම් නාමය, වර්ගය හා සංකේත අංක ඇතුළත් ස්ටිකර් අලවා තිබීම වැනි කරුණු භෞතික විගණනයේදී තහවුරු විය. තවද තීන්ත පෑඩ් සඳහා සාම්පල් 100 ක් රාජ්‍ය ආයතනයක් මගින් එක් නිෂ්පාදන නාමයකින් සිදුකර තිබුණ අතර, තීන්ත පෑඩ් 14,500 ක් ලබා ගැනීමේදී වෙනත් නිෂ්පාදන නාමයකින් පෞද්ගලික සමාගමකින් ඇණවුම් කර තිබුණි.

(ix) දෙපාර්තමේන්තුව විසින් 2014 පෙබරවාරි 28 දින ආරම්භ කරන ලද නව පරිගණකගත හැඳුනුම්පතක් නිකුත් කිරීමේ කටයුතුද දැනට සිදු කරනු ලබයි. සිංහල හා දෙමළ භාෂාවලින් තොරතුරු ඇතුළත් කර තිබෙන මෙම හැඳුනුම්පතට ජීව දත්ත තොරතුරු ඇතුළත් කිරීම මගින් උක්ත ව්‍යාපෘතිය යටතේ නිකුත් කිරීමට අදහස් කරනු ලබන විද්‍යුත් ජාතික හැඳුනුම්පතට සමාන ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ හැකිවේ. ඒ අනුව දැනට සිදුකරනු ලබන ක්‍රමවේදය වැඩි දියුණු කිරීම මගින් ව්‍යාපෘතිය සඳහා වැය කරනු ලබන විශාල මුදලක් ඉතිරි කරගැනීමට හැකියාව පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 7.6 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 25 | 14 | 11 | - |
| (ii) | තෘතීයික මට්ටම | 04 | 01 | 03 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 1,195 | 977 | 218 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 139 | 123 | 16 | - |
| (v) | වෙනත් | - | 01 | - | 01 |
| | එකතුව | 1,363 | 1,116 | 248 | 01 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 248 ක් පැවැති අතර, එම පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් හා ගණකාධිකාරී සේවා මණ්ඩලයෙන් ඉල්ලුම් කර තිබුණි.

## 8. ශීර්ෂය 291 - වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### 8.1 විගණන විෂය පථය

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 08 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 8.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 8.3 විගණන නිරීක්ෂණය

---------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 8.4 සිට 8.14 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

--------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසි |
|---|---|---|
| (i) | වැය ලෙජරය | මුදල් රෙගුලාසි 447 |
| (ii) | පාඩු හා හානි ලේඛන | මුදල් රෙගුලාසි.110 |
| (iii) | තැන්පත් ලේඛන | මුදල් රෙගුලාසි 414 |
| (iv) | අත්තිකාරම් ලෙජරය | මුදල් රෙගුලාසි 420 |
| (v) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

### (ආ) අයවැය විචලනය

--------------------

වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ත් සියයට 70 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### (ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

--------------------------------------

විෂය අංක 29101 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිටි තිබුණු ශේෂවල එකතුව රු. 1,485,735 ක් විය.

## 8.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 8.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 ජූලි 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 8.4.2 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් හෝ ඉටු කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

### 8.4.3 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව 2013 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පවත්වා නොතිබුණි.

## 8.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් කිරික්ෂණයන් කරනු ලැබේ.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත විග්‍රහ කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවැති කාලය |
|---|---|---|---|
| (i) | වාහන | 05 | වර්ෂ 04 |
| (ii) | වාහන - ට්‍රිපර් රථ | 03 | වර්ෂ 03 |
| (iii) | යන්ත්‍ර සූත්‍ර | 02 | වර්ෂ 04 |
| (iv) | ගේබියන් ප්ලාස්ටික් දැල් | 236 | වර්ෂ 06 |
| (iv) | ග්‍රීන් නෙට් | මීටර් 220 | මාස 03 |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**--------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 31 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව එම වාර්තාව 2014 මැයි 07 දින ඉදිරිපත් කර තිබුණි.

(ii) 2013 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

**----------------------------**

දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු. 639,518,227 ක් වූ අතර, එම බැරකම් වර්ෂ 01 ට අඩු කාලයක සිට පැවැත එන ශේෂ විය. මුදල් රෙගුලාසි 94 ට පටහැනිව පුනරාවර්තන වැය විෂයයන් හතරක ඉතිරිය රු.44,376 ක් ඉක්මවා රු.3,456,538 ක්ද, මූලධන වැය විෂයයන් දෙකක ඉතිරිවීම් රු.380,742 ක් ඉක්මවා රු.258,251 ක්ද, වශයෙන් එකතුව රු.3,714,789 ක බැරකම්වලට එළඹ තිබුණි.

**8.6 අනුකූල නොවීම්**

**-----------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**----------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති සහ රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතේ 31 (1), 31 (2) සහ 31(4) වගන්ති | 5,991,496 | 2013 වර්ෂයේදී කඩා ඉවත්කිරීමේ නියෝග 326 ක් නිකුත් කර තිබුණද, 2013 ප්‍රගති වාර්තා අනුව කිසිදු කඩා ඉවත්කිරීමක් සිදු කර නොතිබුණි. කෙසේ වුවත්, මේ සඳහා රු.5,991,496 ක් වැය කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 137 සහ 138 | 825,000 | දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයක් යාපනයේ ස්ථාපිත කිරීමේ අරමුණින් යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගොඩනැගිල්ලක කොටසක් වෙන්කර ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරයා සමඟ 2013 සැප්තැම්බර් 12 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර එම ගිවිසුමට එළඹීමටත් පෙර එනම් 2013 මාර්තු 20 දින මෙම කාර්යය සඳහා යාපනය දිස්ත්‍රික් ලේකම් වෙත රු. 825,000 ගෙවා තිබුණි. එහෙත් ගිවිසුම අනුව අදාළ කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක කොටසක් වෙන්කර සකස් කිරීමේ කොන්ත්‍රාත්තුව 2013 ඔක්තෝබර් 31 දින අවසන් කළ යුතු වුවද 2014 ජූලි 18 වන විටත් එම කාර්යය අවසන් කර නොතිබුණි. |

## 8.7 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

මාරවිල - තලවිල දියේ ගිලුණු දිය කඩන 03 ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය.

(අ) ඇස්තමේන්තුගත පිරිවැය රු. 107,530,000 ක් වූ මෙම ඉදිකිරීම සඳහා 2012 මාර්තු 02 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර 2012 ජූනි 02 දින වැඩ නිම කළ යුතුව තිබුණි. 2013 දෙසැම්බර් 31 දින වනවිට රු.52,589,405 ක් වැය කර තිබුණත් කොන්ත්‍රාත්කරුගේ

අකාර්යක්ෂමතාවය සහ ගිවිසුම් පරිදි වැඩ නිම නොකිරීම මත 2014 පෙබරවාරි 25 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි.

(ආ) මෙම කොන්ත්‍රාත්තුව ගිවිසුම් පරිදි වැඩ නිම නොකිරීම නිසා වරින් වර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබූ නමුත් ගිවිසුම් පරිදි ක්‍රියා නොකිරීම සහ සෑහීමකට පත්වන පරිදි ඉදිකිරීම් කිරීමට අපොහොසත් වීම මත 2013 ජූලි 10 දින සිට බලපැවැත්වෙන පරිදි කොන්ත්‍රාත්කරු ඉවත් කර තිබුණි. එසේ වුවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.5 මාර්ගෝපදේශය ප්‍රකාරව අදාළ ආයතනය අසාදු ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නියමිත දිනට වැඩ නිම නොකිරීම හේතුවෙන් ඉහත ගිවිසුමේ 49(1) හා 50(1) වගන්තිය අනුව, කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 0.05 ක් එනම් රු. 10,753,000 ක් ප්‍රමාද ගාස්තු අය කර ගත යුතු වුවත් 2014 ජූලි 31 වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) මෙම දියකඩනය සඳහා කොන්ත්‍රාත්කරු විසින් යොදා ගනු ලැබූ නිසි පරිදි ක්‍රියා නොකරන හා අනතුරකට ලක්ව ඇති බත්තල් සඳහා නිසි අනුමැතියකින් තොරව 2013 පෙබරවාරි 14 දින රු.මිලියන 04 ක් ගිවිසුම්ගත මුදලට අමතරව ගෙවීම කර තිබුණි. මෙම බත්තල් අනතුරට ලක් වී ක්‍රියාවිරහිත වි තිබුණු අතර 2014 පෙබරවාරි 25 දින වන විටත් කොන්ත්‍රාත්කරු විසින් ඒවා ඉවත් කර නොගැනීම නිසා මුහුදේ ගිලෙමින් තිබුණි.

## 8.8 කාර්යසාධනය

2013 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුනොකර තිබුණ අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

| | ඉදිකිරීම් ව්‍යාපෘතිය | ප්‍රතිපාදනය | උපයෝජනය | 2013 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් තත්ත්වය |
|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | |
| (i) | උල්හිටිය - දකුණ මීටර් 80 දියකඩනය | 15.0 | 15.81 | ඉදිකිරීම් කටයුතුවලින් සියයට 60 ක් සම්පූර්ණ කර තිබුණි. |
| (ii) | උස් වැටකෙයියාව දිය කඩන 03 | 150.0 | 15.09 | ඉදිකිරීම් කටයුතු සියයට 20 ක ප්‍රගතියක් විය. |
| (iii) | කොග්ගල මීටර් 90 ක් දිග ග්‍රොයිනය | 10.0 | 20.18 | ප්‍රතිපාදිත වියදම මෙන් දෙගුණයක් වියදම් කර තිබුණද සියයට 50 ක් ඉදිකිරීම් අවසන් කර තිබුණි. |
| (iv) | මැඩිල්ල තංගල්ල (SBW 1) මීටර් 120 ක් දිග දියකඩනය | 60.0 | 16.88 | සක්මන් මගෙහි සියයට 17 ක් සම්පූර්ණ කර තිබුණි. |
| (v) | මැඩිල්ල තංගල්ල (SBW2) මීටර් 80ක් දිග දියකඩනය | 40.0 | 8.69 | සක්මන් මග සියයට 31 ක් සම්පූර්ණ කර තිබුණි. |
| (vi) | හදිසි වෙරළ ආරක්ෂිත ඉදිකිරීම් | 50.0 | 41.23 | ඉදිකිරීම්වලින් සියයට 82 ක් සම්පූර්ණ කර තිබුණි. |
| (vii) | වෙරළ තීරය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 200.0 | 8.23 | සංවර්ධන කටයුතු සියයට 4ක් සම්පූර්ණ කර තිබුණි. |
| (viii) | වෙරළ ඉංජිනේරු විමර්ශනය | 10.0 | 6.71 | සියයට 67 ක ප්‍රගතියක් විය. |
| (ix) | බලපත්‍ර නිකුත් කිරිම | 0.4 | 0.36 | සියයට 25 ක ප්‍රගතියක් විය. |

## 8.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

----------------------------------

ගල්කිස්ස වෙරළ තීරය ප්‍රසංගයකට වෙන් කරදීම වෙනුවෙන් අය කළ රජයේ ගාස්තු රු.30,000 ක් වෙනුවෙන් ලබා ගෙන තිබුණු පුද්ගලික චෙක්පත අඟරු වී තිබුණද, එම මුදල 2014 ජූලි 31 දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 8.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

------------------------------

දික්ඔවිට ධීවර වරාය ව්‍යාපෘතිය අවසන් වීමෙන් අනතුරුව එම ව්‍යාපෘතියට පාවිච්චි කරන ලද ටිපර් රථ 3 ක් සහ ලොරි රථයක් 2011 දෙසැම්බර් 27 දින දෙපාර්මේන්තුව වෙත ලබා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එම රථ පවරා ගැනීමේදී බදු වශයෙන් රු. 4,055,764 ක් 2011 නොවැම්බර් 16 දින ශ්‍රී ලංකා රේගුවට ගෙවා තිබුණ අතර දෙපාර්තමේන්තුවට 2012 ජනවාරි 10 දින පවරා ගෙන තිබුණි.

(ආ) එම රථ හතර පවරා ගැනීමට පෙර මෝටර් රථ ඉංජිනේරුවරයකු ලවා පරීක්ෂණ වාර්තාවක් ලබා ගෙන නොතිබුණු අතර වාහන හතර පරීක්ෂාව සඳහා 2012 පෙබරවාරි 06 දින පත් කළ කමිටු වාර්තාව අනුව, පවරා ගන්නා අවස්ථාව වන විටද ධාවනයට සුදුසු තත්ත්වයේ නොතිබු බව දක්වා තිබුණි. දෙපාර්තමේන්තුවට වත්කම් පවරා ගැනීමේදී නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම නිසා එම වාහන සඳහා බදු සහ අනෙකුත් වියදම් සඳහා වැය කළ රු.4,092,264 ක් වූ වියදම නිෂ්ඵල වි තිබුණි.

(ඇ) වාහන හතර පවරා ගත් දින සිට ධාවනය කර නොතිබුණු අතර ඒ සඳහා දෛනික ධාවන සටහන් සහ ලොග් සටහන් පොත් පවත්වා ගෙන නොතිබුණි. මෙම වාහන පාවිච්චියට නුසුදුසු බවත් වෙන්දේසි කළ යුතු බවත් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලින් පෙන්වා දී තිබුණත් 2014 ජූලි 31 දින වන විටත් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) එක් වාහනයක් අළුත් වැඩියාව සඳහා රු. 1,324,656 ක ඇස්තමේන්තුවක් ලබා ගෙන සේවා ලබා ගැනීමට පෙර ඇස්තමේන්තු මුදලින් රු.500,000ක් ගෙවා තිබුණි. මෙම සේවාව ලබා ගෙන නොතිබුණු අතර 2014 ජූලි 31 වන විටත් එම මුදල ආපසු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි

## 8.11 අනාර්ථික ගනුදෙනු

වෙරළ කලාප තුළ ආරම්භ කරන ලද හරිත වන වගා වැඩසටහන නිසි පරිදි නඩත්තු කිරීමේ ක්‍රමවේදයක් නොමැතිවීම නිසා 2013 වර්ෂයේ දෙපාර්තමේන්තු ප්‍රගති වාර්තාව පරිදි එම වැඩසටහන සඳහා රු. 962,150 ක් වැය කළ අතර එහි භෞතික ප්‍රගතියක් නොතිබුණි. ඒ අනුව වැය කළ මුදල නිෂ්ඵල ව තිබුණි.

## 8.12 විසඳා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පසු විපරම් කටයුතු නිම කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2011 | 1.3 (ඇ) | ප්‍රසම්පාදන සැලැස්ම සකස් නොකිරීම. |
| 2012 | 1.4.2 | |
| 2011 | 1.3 (උ) | පාලන ගිණුම් සහ කේවල ගිණුම් ශේෂ ලේඛනයේ වූ වෙනස රු. 1,902 නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| 2012 | 1.3 (උ) (ii) | |
| 2012 | 1.4.3 | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත නොකිරීම. |
| 2012 | 1.4.4 | විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක නොකිරීම. |
| 2012 | 1.7 | මුදල් රෙගුලාසි 169(2) විධිවිධානවලට පටහැනිව පෞද්ගලික ආයතනයකින් ලද චෙක්පත උපලබ්ධි වීමට පෙර සේවා සැපයීම හා එම චෙක්පත අඟරු වී තිබුණද ඒ සඳහා මුදල් අය කර නොගැනීම. |

## 8.13 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ) වෙරළ ආරක්ෂණ වැඩසටහන්**
**------------------------------**

වෙරළ ආරක්ෂණ වැඩසටහන යටතේ මුහුදු වෙරළෙහි යම් ස්ථානයක වෙරළ ඛාදන තත්ත්වයක අවදානමක් හඳුනාගත් පසු එය අවම කිරීම දෙපාර්තමේන්තුවේ අරමුණ වේ. ඒ සඳහා යොදනු ලබන පිළියම් හෝ ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මූලික අධ්‍යයනයක් කර අවශ්‍ය වන්නේ කුමන පිළියමක්ද යන්න සළකා බලා කටයුතු කිරිම දෙපාර්තමේන්තුවෙන් අපේක්ෂා කරයි. කෙසේ වෙතත් අපේක්ෂිත අරමුණු ඉටු නොවූ අවස්ථා හා එම අරමුණු කරා ලඟා වීමට අනුමත ව්‍යාපෘතිය වෙනස් කිරීම්, එකතුකිරීම් හා අත්හැර දැමීම් කිරීමට සිදුව තිබුණු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) මීගමුව දූන්ගල්පිටිය මීටර් 220 ක් දිග රිවට්මන්ට් (Revetment) සැලැසුම් කර තිබුණත් ඉදි කිරීම් කර තිබුණේ ග්‍රොයින (Groyner) 06 කි.

(ii) 2011 වර්ෂයේදී රු.මිලියන 25.87 ක් වැයකර මීටර් 270 ක් දිග කැපුන්ගොඩ දියකඩනය හා මීටර් 75 ක් දිග ග්‍රොයිනය ඉදිකර තිබුණද, වැලිපිරීම සහ අපේක්ෂිත අරමුණ වූ බෝට්ටු නතර කිරීම කළ නොහැකි වූ නිසා දියකඩනයෙන් මීටර් 110 ක් ඉවත් කිරීමට 2013 වර්ෂයේදී තීරණය කර තිබුණි. මෙම ඉදිකිරීම සඳහා වැය කළ මුදල රු.19,578,933 ක් වූ අතර කඩා ඉවත් කිරීම සඳහා රු.6,202,332 වැය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවට සිදුවූ පාඩුව රු.25,781,265 ක් විය.

(iii) ඉංජිනේරු ඇස්තමේන්තු හා සැලැසුමට අනුව, උණවටුන දියකඩනය දියේ ගිලුණු දියකඩනයක් ලෙස ඉදිකිරීමට සැලැසුම් කර තිබුණු අතර ඉදිකිරීමේ පහසුව සඳහා ජලතලයේ සිට මීටර් 2.5 ක් උසින් ඉදිකර තිබුණි. ජල මට්ටමෙන් උඩට ඉදිකරන ලද ප්‍රමාණය ඉවත් කරමින් පැවති එම කාර්යය නතර කිරීමට 2013 මැයි 08 දින ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. එයින් කොටසක් ඉවත් කිරීම සඳහා දැරීමට සිදු වූ වියදම රු.1,462,200 ක් වූයෙන් එය දෙපාර්තමේන්තුව විසින් දරන ලද නිෂ්කාර්ය වියදමක් විය. තවද දියේ ගිලුණු දියකඩනයේ සාර්ථකත්වය සඳහා ජලතලයේ සිට මීටර් 2.5 ක් උසින් ඉදිකළ ප්‍රමාණය ඉවත් කළ යුතු වුවද එසේ ඉවත් නොකිරීම නිසා එම ඉදිකිරීමට ආසන්නව මුහුදු ඛාදනයක් සිදුවෙමින් පැවතුණි.

(iv) දියකඩනයක් ඉදිකිරීමෙන් වැලි වෙරළේ රඳවා ගැනීමට උපකාර වන අතර වැලි පෝෂණයක් සිදු කරන්නේ නම් ඊට පෙර එම ප්‍රදේශයේ දියකඩන ඉදිකිරිම් කළ

යුතු විය. නමුත් වැලිපෝෂණය සිදු කිරීමට පෙර ඉදිකිරීමට සැලැසුම් කළ දියකඩන ඉදිකිරීම් ප්‍රමාද වීම නිසා රු. මිලියන 134.7 ක් වැය කළ වැලිපෝෂණ ව්‍යපෘතිවල සාර්ථකත්වයක් නොතිබුණි.

**(ආ) බලපත්‍ර නිකුත් කිරීම**

බලපත්‍ර නිකුත් කිරිම සම්බන්ධයෙන් කළ නියැදි පරික්ෂාවේදි පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිකිරීම් සඳහා අවසර පත්‍ර නිකුත් කිරිමේදී අනුගමනය කළ යුතු සාමාන්‍ය ක්‍රියාපරිපාටියෙන් බැහැරව උපදේශක සභාවේ ආවරණ අනුමැතියට යටත්ව අනුමැතිය ලබා දී තිබුණි. එසේ ලබා දුන් ආවරණ අනුමැතියට උපදේශක සභාවේ විධිමත් අනුමැතිය ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ii) වෙරළ කලාපයේ සංවර්ධන කාර්යයන් සඳහා අවසර පත්‍ර නිකුත් කිරීමේදී ඉදිකිරීම් කටයුතු වෙරළ ආරක්ෂිත කලාපයේ සිට කොපමණ දුරකින් ආරම්භ කළ යුතුද යන්න බලපත්‍රයේ සඳහන් කළයුතු වුවත්, එසේ සඳහන් නොකර මීගමුව වෙරළ කලාපයේ සංවර්ධන කාර්යයන් සඳහා අවසරපත්‍ර නිකුත් කර තිබුණු අවස්ථා විය.

(iii) නියමිත සීමාවෙන් බැහැරව (වෙරළ සීමා නොසළකා) ඉදිකිරීම් බලපත්‍ර ලබා දීම නිසා වෙරළ තීරයට හානි සිදුවූ අවස්ථා විය.

- මොරගල්ලේ පිහිටි හෝටලය වෙරළ සංරක්ෂණ ප්‍රදේශයේ සිට මීටර් 40 සීමාව ඇතුළත ඉදිකිරීම් නොකළ යුතු වුවත්, එම හෝටලය පිටුපස දිග අඩි 200 ක් පමණ කොන්ක්‍රීට් බැම්මක් ඉදිකර තිබුණි. එබැවින් මෙහි වෙරළ තීරයක් දක්නට නොතිබුණි.

- මොරගල්ලේ පිටිහි තවත් හෝටලයක වෙරළ සංරක්ෂිත සීමාව නොසළකා මිටර් 170 ක් පමණ දිග ගේබියන් බැම්මක් ඉදිකර තිබුණ අතර හෝටලයෙන් බැහැර වන අපද්‍රව්‍ය මුහුදට එක්කර තිබුණි.

- බේරුවල නගරයේ ඉදිවන ධීවර වෙළඳසැල බලපත්‍ර ලබාදුන් ස්ථානයේ සිට මීටර් 50 ක් පමණ ඈතින් වෙනත් ස්ථානයක වෙරළ සීමාවේ ඉදිකර තිබුණි.

(iv) කඩා ඉවත් කිරීමේ නියෝග නිකුත් කිරීම් සහ ව්‍යාපෘති නිමකිරීම් පිළිබඳ පසු විපරම් නොකිරීම නිසා ව්‍යාපෘතිවල දෙපාර්තමේන්තුවේ අරමුණ ඉටු නොවූ අවස්ථා විය.

- එක්තරා හෝටලයක් කඩා ඉවත් කිරීමේ නියෝග නිකුත් කර තිබුණද, 2014 පෙබරවාරි 21 දින වන විටත් කඩා ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

- ගාල්ලේ ඉදිකළ තොරතුරු මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ පෞද්ගලික ආපනශාලාවක් පවත්වා තිබුණි.

**(ඇ) අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරිමට නියෝග නිකුත් කිරිම**

2013 වර්ෂයේ වැල්ලවත්ත, ගල්කිස්ස, දෙහිවල හා බම්බලපිටිය යන ප්‍රදේශවලින් අනවසර ඉදිකිරීම් 139 ක් හඳුනාගෙන තිබුණද,ඒවා සඳහා කඩා ඉවත් කිරීම් නියෝග නිකුත් කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

## 8.14 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 37 | 18 | 19 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 01 | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 332 | 201 | 131 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 174 | 73 | 101 |
| | එකතුව | 547 | 293 | 254 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 254 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 9. ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

### 9.1 විගණන විෂය පථය

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 09 දින අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 9.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන් , රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**9.3 විගණන නිරීක්ෂණය**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සහ (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 9.4 සිට 9.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසි |
|---|---|
| බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය |

**(ආ) විගණන සාක්ෂි නොවීම**

ගෙවීම් වවුචර් ආදී වූ අවශ්‍ය සාක්ෂි දෙපාර්තමේන්තුවෙහි නොතිබීම නිසා එකතුව රු.379,250 ක මුදලකට අදාල වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**9.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**9.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 1.4.1 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**9.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**9.5 වත්කම් කළමනාකරණය**

**බේරුම් නොකළ බැරකම්**

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.101,951,447 ක් වු අතර, එම බැරකම් වර්ෂයකට අඩු කාලයක සිට පැවැත එන ශේෂ විය.

**9.6 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මුදල් රෙගුලාසි 94 | 97,924,615 | සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 18 ක ප්‍රතිපාදන ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 103(1) හා 104(1) | - | සමාලෝචිත වර්ෂය තුළ සිදුවු වාහන හදිසි අනතුරු 13 ක් සම්බන්ධයෙන් අලාභහානියේ වටිනාකම ගණනය කර මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 237(ආ) | 349,840 | භාණ්ඩ මිලදී ගැනිම සඳහා ලබා දී තිබුණු අත්තිකාරම් පියවා ගැනීමකින් තොරව සැපයුම්කරු වෙත අවස්ථා 06 |

| | | |
|---|---|---|
| | | ක දී තවත් රු.29,229,290 ක් ගෙවා තිබුණි. |

**(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| (i) 1998 අප්‍රේල් 03 දිනැති අංක12/98 දරන චක්‍රලේඛය | 14,841 | චක්‍රලේඛ විධිවිධානයන්ට පටහැනිව සම්මුඛ පරීක්ෂණ දීමනා වැඩිපුර ගෙවා තිබුණි. |
| (ii) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | 467,455 | වාහන 07 ක අළුත්වැඩියා සඳහා ගෙවීමට පෙර අළුත්වැඩියාවන් සාර්ථක ලෙස සිදුකර ඇති බවට සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයකුගේ වාර්තාවක් ලබාගෙන නොතිබුණි. |

## 9.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 09 | 06 | - |
| (ii) | තෘතියික මට්ටම | 15 | 10 | 05 | - |
| (iii) | ද්විතියක මට්ටම | 21 | 12 | 09 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 30 | 26 | 04 | - |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 30 | 33 | - | 03 |
| (vi) | සිවිල් ආරක්ෂක බලකාය | 40,000 | 37,975 | 2,025 | - |
| | එකතුව | 40,111 | 38,065 | 2,049 | 03 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 2,049 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 10. ශීර්ෂය 325 - ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

### 10.1 විගණන විෂය පථය

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 04 දින අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 10.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන් , රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 10.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ

පොදු නිරීක්ෂණ සහ පහත 10.4 සිට 10.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**( අ ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසි** | **නිරීක්ෂණය** |
|---|---|---|
| බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නැත |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නැත. |
| පරිගණක මෘදුකාංග හා උපාංග පිළිබඳ ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය | යාවත්කාලීන කර නැත |

**(ආ) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.390,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 07 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 55 සිට සියයට 93 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට ගිණුම් අංක 7002/0000/00/0409/0013/000 යටතේ රු.248,939 ක අග්‍රිම ශේෂයක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) නිලධාරීන් දෙදෙනෙකු විසින් ලබාගෙන තිබුණු තත්කාර්ය අතුරු අග්‍රිම පිළිවෙලින් රු.11,025 ක් හා රු.4,000 ක් මුදලින් නිරවුල් කළ යුතු වුවත්, මුදල් රෙගුලාසි 371 ට පටහැනිව කාර්ය නිම කර පිළිවෙලින් දින 75 ක් හා දින 27 ක් අත රඳවා ගෙන එම මුදල් නිරවුල් කර තිබුණි. එසේම තවත් නිලධාරියෙකු විසින් ලබාගෙන තිබුණු රු.20,000 ක තත්කාර්ය අතුරු අග්‍රිමයක් දින 13 ක් අදාළ කාර්යයට නොයොදවා අත රඳවාගෙන තිබුණි. දෙපාර්තමේන්තුවේ තත් කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරිම හා නිරවුල් කිරීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන අනුව කටයුතු නොකිරීම නිසා රජය සතු මුදල් අයථා පරිදි පරිහරණය කිරීමට ඉඩ පැවැතුණි.

(ii) 2013 නොවැම්බර් 18 දිනැති අංක 04/2013 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයේ 1 ජේදය ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තම කාර්යාලයේ ගිණුම් පියවීම පිණිස වගකිව යුතු මාණ්ඩලික නිලධාරියෙකු පත්කර නොතිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

------------------------

දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට අංක 6000/0000/00/0015/0171/000 දරන තැන්පත් ගිණුමේ ශේෂය රු.188,252 ක් විය. එම ශේෂයෙහි වු වර්ෂ 02 කට වැඩි කාලයක සිට පැවත එන රු.33,675 ක් වු තැන්පතුවක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 10.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---------------------------------------

**විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරිම**

--------------------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි.

## 10.5 වත්කම් කළමනාකරණය

------------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ)** **ඌන උපයෝජිත වත්කම්**

-----------------------------

2012 සහ 2013 යන වර්ෂවල මිල දී ගෙන තිබුණු රු.516,446 ක් වු භාණ්ඩ විගණන දිනය වු 2014 ජුනි 10 දින වන විටත් නිකුත් නොකර ගබඩාවේ තිබුණු අතර මිලදී ගෙන වසර 02 ක් ඉක්මවු බැටරි චාජරයක් ද ඒ අතර තිබුණි.

**(ආ)** **වාහන පිළිබඳ වාර්ෂික සමීක්ෂණ පැවැත්වීම**

----------------------------------------------------

මුදල් රෙගුලාසි 756, 757, හා 1647(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තුව සතු වාහන සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් කර එම වාර්තා 2014 අප්‍රේල් 30 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ)** **බේරුම් නොකළ බැරකම්**

-----------------------------

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දින වන විට බේරුම් නොකළ වර්ෂයකට අඩු කාලයක් මුළුල්ලේ පවතින රු.3,745,969 ක් වු බැරකම් විය.

**10.6** **බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව නිකුත් කළ නමුත් කල් ඉකුත් වු එකතුව රු.6,600 ක් වටිනා චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ආ)** දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව මුදල් පොත අනුව දැක්වෙන බැංකු ශේෂය රු.109,875 ක් ලෙස දක්වා තිබුණ ද, එදිනට මුදල් පොත අනුව දැක්වෙන බැංකු ශේෂය රු.111,439 ක් වී තිබුණි. ඒ අනුව බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම සඳහා පාදක කර ගෙන තිබුණු මුදල් ශේෂය රු.1,564 ක වෙනසක් පැවැතුණි.

## 10.7 කළමනාකරණ දුර්වලතා

------------------------------

නියැදි විගණන පරීක්ෂණවල දී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තුව විසින් වැයකර තිබුණු රු.549,234 ක් වූ ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන විදේශීය අමුත්තන්ට අවස්ථා 12 කදී එකතුව රු.346,064 ක් වටිනා ත්‍යාග මිලදී ගෙන තිබුණත්, එම ත්‍යාගවලින් වැඩි ප්‍රමාණයක් පෞද්ගලික ස්වරූපයෙන් ප්‍රදානය කර තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ රියදුරන් හා වාහන භාර නිලධාරී විසින් පිළියෙල කර තිබුණු දෛනික ධාවන සටහන් සහ මාසික සංසිද්ධි වාර්තාවල ඇතුළත් කරුණු පරීක්ෂා කිරීමේදී වෙනස් කිරීම, මකන දියර භාවිතා කිරීම, පැන්සලෙන් සටහන් කර තිබීම සහ වාහනය පාවිච්චි කරන ලද නිලධාරියා කෙටි අත්සන් නොකිරීම යනාදී අඩුපාඩු හා දුර්වලතා විය. දෛනික ධාවන සටහන් හා මාසික සිංසිද්ධි වාර්තා පිටපතක් සහිතව පිළියෙල කර එහි මුල් පිටපත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් මුල් පිටපත පමණක් පිළියෙල කර තිබුණු අතර එය විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 10.8 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවයේ නියුතු නිලධාරීන් 61 ක් සහ නැවියන් 914 ක් කාර්ය මණ්ඩලය වශයෙන් දෙපාර්තමේන්තුවේ සේවය කර තිබුණු අතර දෙපාර්තමේන්තුවට අවශ්‍ය කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.